# 3. කෘෂිකර්මය, ධීවර සහ වන සම්පත්

## 3.1 නිෂ්පාදන උපනති

1995 වර්ෂය තුළදී කෘෂිකාර්මික බෝග රාශියක සාර්ථක ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී. යහපත් කාලගුණික තත්ත්වය හා ප්‍රධාන අපනයන බෝග සඳහා ආකර්ෂණීය මිල ගණන් පැවතීම මීට හේතු විය. විශේෂයෙන්ම, 1995 වර්ෂය රබර් මිල ඉතා ඉහළ මට්ටමක පැවති උත්පාත වර්ෂයක් විය. 1994 වර්ෂයේ දක්නට ලැබුණු වාර්තාගත ඉහළම නිෂ්පාදන මට්ටම ද අභිබවා යමින් තේ සහ වී නිෂ්පාදනය පිළිවෙලින් සියයට 2 කින් සහ සියයට 5 කින් වැඩි විය. පොල් නිෂ්පාදනය සියයට 5 කින් වැඩි වූ අතර, මෙය 1986 ට පසුව දක්නට වූ වාර්තාගත නිෂ්පාදනය විය. රබර් නිෂ්පාදනය සුළු වර්ධනයක් පෙන්නුම් කල අතර සීනි නිෂ්පාදනය සියයට 1 කින් පහත වැටුණි. වර්ෂය තුලදී අනෙකුත් කෘෂිකාර්මික බෝග නිෂ්පාදනයෙහි මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණු අතර සමහර බෝගයන්හි විශාල වැඩිවීම් දක්නට ලැබුණි. ගැඹුරු මුහුද හා ජල ජීවී මත්ස්‍ය නිෂ්පාදනය වැඩිවීම හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදනය සියයට 6 කින් වර්ධනය විය.

**සංඛ්‍යා සටහන 3.1**

**ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන සහ මිල වෙනස්වීම්**

| අයිතමය | ඒකකය | නිෂ්පාදනය | | 1995 වෙනස්වීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|
| | | 1994 | 1995 | නිෂ්පාදනය | මිල ගණන් |
| තේ | (කි.ග්‍රෑ. දශලක්ෂ) | 242 | 246 | 2 | 11 |
| රබර් | (කි.ග්‍රෑ. දශලක්ෂ) | 105 | 106 | 0 | 43 |
| පොල් | (ගෙඩි දශලක්ෂ) | 2,622 | 2,755 | 5 | 13 |
| වී | (මෙ.ටො. දහස්) | 2,684 | 2,810 | 5 | -2 |
| සීනි | (මෙ.ටො. දහස්) | 72 | 71 | -1 | -3 |
| මත්ස්‍ය | (මෙ.ටො. දහස්) | 224 | 238 | 6 | 22 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.2 කෘෂිකාර්මික ප්‍රතිපත්ති

වැවිලි කර්මාන්ත අංශයේ ප්‍රතිපත්තිය ඉතා පැහැදිලි වූ අතර එම අංශයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම හා සම්බන්ධව සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළේය. 1995 වර්ෂයේදී රාජ්‍ය අයිතිය ඇති ප්‍රාදේශිය වැවිලි සමාගම්වල පෞද්ගලික කළමණාකරණය සඳහා දැනට පවත්නා පස් අවුරුදු බදු ගිවිසුම් ක්‍රමය වෙනුවට, 1992 සිට බලපාන පරිදි 53 අවුරුදු දීර්ඝ බදු ගිවිසුම් ක්‍රමයක් හඳුන්වාදීම රජය විසින් ආරම්භ කරන ලදී. වැවිලි නොවන කෘෂිකාර්මික අංශයට සාධක බොහොමයක්, විවිධ ආකාරයේ බලපෑම් ඇති කරනු ලැබිය. අති විශාල වී අස්වැන්නක් ලැබීම හේතුවෙන් සහල් මිල පහත වැටුණි. තිරිඟු පිටි සහනාධාරය නිසා සාපේක්ෂ මිල ගණන්වල වෙනස්වීම වී ගොවීන්ට අහිතකර වූ බැවින් මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර විය. පාරිභෝගික ඉල්ලුම ලාභදායී තිරිඟු පිටි ආශ්‍රිත නිෂ්පාදනයන්ට නැඹුරුවීම සහල් මිල ගණන් තව දුරටත් පහත වැටීමට හේතු විය. මෙය වී අලෙවි මණ්ඩලයට සහතික මිල ක්‍රමය යටතේ වෙළඳපලෙන් වී මිලදී ගැනීම වැඩි කිරීමට ප්‍රධාන වශයෙන් හේතු විය. වී අලෙවි මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය, ඒ වන විට ගොඩනැඟී තිබූ පෞද්ගලික අලෙවිකරණ ක්‍රමයට අනිසි ලෙස බලපෑම් ඇති කරන ලදී. මේ අතර, වී අලෙවි මණ්ඩලයේ එක් රැස් වී තිබූ සහල් තොග අලෙවි කර ගැනීමට නොහැකිවීම නිසා, දේශිය බැංකු ක්‍රමයෙන් විශාල ලෙස ණය (රුපියල් බිලියන 2 ක්) ලබා ගැනීමට සිදු විය. මීට අමතරව 1995 වර්ෂය තුලදිද සමහර කෘෂිකාර්මික බෝග සඳහා (අර්තාපල්, ලොකු ළූණු සහ මිරිස්) ආනයන බලපත්‍ර නිකුත් කරන ලදී. ආනයන බලපත්‍ර ක්‍රමයන් බොහෝවිට ප්‍රමාණාත්මක ආනයන පාලනයන් වන අතර පාරිභෝගිකයනට විශාල පිරිවැයක් ඇති කරමින් වෙළෙඳපොළ කාර්යක්ෂමව ක්‍රියාත්මකවීමටද බාධකයක් වේ. විනිවිද පෙනෙන සුළු වෙනස්වන තිරුබදු ක්‍රමය, ගොවීන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයන අතර පාරිභෝගික පිරිවැයද අවම කරනු ලබයි. තවදුරටත් විනිවිද පෙනෙන සහ ක්‍රමවත් කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදන ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ ජාලය තුල පෞද්ගලික අංශයේ සහභාගිත්වය වැඩි කිරීමට උනන්දු වනු ඇත. මේ අතර 1994 වර්ෂයේ නැවත හඳුන්වා දෙනු ලැබූ පොහොර සහනාධාර ක්‍රමය 1995 වර්ෂයේදී නොකඩවා ක්‍රියාත්මක වුවද, මුළු සහනාධාරය සීමා කරන ලදී. කෙසේ වෙතත්, සම්පත් හිඟය නිසා රජය මගින් ආනයන කරුවන්ට කරනලද සහනාධාර ගෙවීම ප්‍රමාද විය.

වර්ෂය තුලදී කෘෂිකාර්මික අංශයේ සිදුවූ ප්‍රධාන ව්‍යුහාත්මක වෙනස වන්නේ ඉහත සඳහන් කළ පරිදි රාජ්‍ය අයිතිය ඇති ප්‍රාදේශිය වැවිලි සමාගම් නවයක කළමණාකරණ පාලන කල් බද්ද අවුරුදු 53 ක් දක්වා දීර්ඝ කිරීම වේ. මීට පෙර ප්‍රාදේශිය වැවිලි කළමණාකරණ සමාගම් 23 හි කළමණාකරණය පෞද්ගලික සමාගම් මගින් කරනු ලැබුයේ, ගිවිසුම්ගත අවුරුදු 5 ක කාලසීමාවක් තුලදී ලාභ බෙදාගැනීමේ පදනම මත වේ. සමහර පෞද්ගලික කළමණාකරණ සමාගම්වලට ඵලදායිතාවය වැඩිකිරීමට හා නිෂ්පාදන පිරිවැය වැඩිවීම සීමා කිරීමට හැකිවුණි. කෙසේ වෙතත්, ගිවිසුමේ කෙටිකාලීන ස්වභාවය නිසා ඔවුන් වැවිලි අංශයේ දිගුකාලීන ආයෝජනයක් කිරීමට උද්යෝගිමත් නොවිණි. මෙය සාධාරණ කාලසීමාවක් සඳහා ඉඩම් භුක්තියත් දිගුකාලීන හිමිකමත් නොමැතිව පාලනය කිරීමට ලැබුන අවස්ථාවකි. වැවිලි අංශයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම උදෙසා දැනට ක්‍රියාත්මක වන පෞද්ගලිකරණ වැඩපිළිවෙල යටතේ, රජය වැවිලි සමාගම් සමඟ දිගුකාලීන කල්බදු ගිවිසුම්වලට එළඹීමට පටන් ගන්නා ලදී. මේ මගින් ඉඩම් භුක්තිය 1992 සිට බලපැවැත්වෙන පරිදි අවුරුදු 53 ක කාලසීමාවක කල් බද්දකට යටත් කෙරුන අතර, කළමණාකරණයේ වාසිය සහ සම්පූර්ණ අවදානම පෞද්ගලික අංශයට දෙන ලදී.

වර්ෂය තුළදී රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ කොමිසම, ප්‍රාදේශිය වැවිලි සමාගම් 10 ක් දිගුකාලීන කල් බද්දකට දීමට තීරණය කෙරිණි. ලාභ උපයන ප්‍රාදේශිය වැවිලි සමාගම්වල මුළු කොටස් වලින් සියයට 51 ක්, ප්‍රාදේශිය වැවිලි සමාගම් කළමණාකරණ සමාගම්වලට විකිණීමට තීරණය කළ අතර පාඩු ලබන ප්‍රාදේශිය කළමණාකරණ සමාගම්වල මුළු කොටස් වලින් සියයට 51 ක් කොටස් වෙළඳපලේ "සියල්ල හෝ කිසිවක් නැත" පදනම මත අලෙවි කිරීමට තීරණය කරන ලදී. සමාගමේ මුළු කොටස් වලින් සියයට 20 ක් මහජනතාවට අලෙවි කළයුතු වූ අතර එයින් සියයට 8 ක්, කොටසකට රුපියල් 10 බැගින් වූ ස්ථාවර මිලකට සුළු ආයෝජකයන් සඳහා වෙන් කරන ලදී. ඉතිරි සියයට 12 ටෙන්ඩර් පදනමක් මත සෑම ටෙන්ඩර හිමියෙකුට ලැබෙන උපරිම ප්‍රමාණය එම කොටසින් සියයට 4 ක සීමාව තුල අලෙවි කිරීමට තීරණය කරන ලදී. වතුවල වැඩ කරන කම්කරුවන් සඳහා සියයට 10 ක් වෙන්කළ යුතු විය. ඉතිරි සියයට 19 කුමන අයුරින් බෙදා හරින්නේද යන්න රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ කොමිසම මගින් තීරණය කර

නොතිබිණි. ජාතික ශුභ සිද්ධිය ආරක්ෂා කිරීමට සහ වෘත්තීය සමිති විරෝධතා අඩු කිරීමට, රජය විසින් සෑම ප්‍රාදේශීය සමාගමකම ස්වර්ණමය කොටසක් තබා ගන්නා ලදී. සෑම ප්‍රාදේශීය වැවිලි සමාගමකම ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂ 200 කට මිල කරන ලද අතර ප්‍රාරක්ෂණය කිරීමෙන් ඊට අදාල අයකිරීම් අඩු කර මුළු වටිනාකම ලබා ගැනීමට සලසන ලදී. ප්‍රාදේශීය වැවිලි සමාගමක ප්‍රාග්ධනයේ විදේශ දායකත්වය සියයට 49 කට සීමා කරනු ලැබිණි.

කොටගල, බගවන්තලාව, අගලවත්ත, කෑගල්ල, කැළණිවැලි සහ හොරණ යන ලාභ උපයන වැවිලි සමාගම් 6, ප්‍රාදේශීය වැවිලි සමාගම්වල කොටස් වලින් සියයට 51 ක් මිලයට ගැනීමේ වගකීම බාර ගන්නා ලදී. ස්ථාවර මිලකට නියම කර තිබූ කොටස් ප්‍රමාණයට මහජන සහභාගිත්වය අඩුවීම හේතුකොටගෙන, ප්‍රාරක්ෂකයනට ඉතිරි කොටස මිලදී ගැනීමට සිදුවිය. වටවල, මඩුල්සීම, මස්කෙළිය සහ ආගරපතන යන පාඩු ලබන ප්‍රාදේශීය වැවිලි සමාගම්වල කොටස් වලින් සියයට 51 ක් "සියල්ලම හෝ කිසිවක් නැත" යන පදනම මත කොටස් වෙළඳපලට ඉදිරිපත් කරන ලදී. 1995 වර්ෂය අවසාන වනවිට ප්‍රාදේශීය වැවිලි සමාගම් 9 ක් (ආගරපතන ප්‍රාදේශීය වැවිලි සමාගම හැර) පෞද්ගලීකරණය කරන ලදී.

වතු වගා අංශයේ ඵලදාව වැඩිකිරීමට නැවත වගාකිරීම්, අළුතින් වගා කිරීම් සහ අතුරු වගා (පොල් සඳහා) සහනාධාර සහ පොහොර සහනාධාර වැනි විවිධාකාර දිරිගැන්වීම් ක්‍රම 1995 වර්ෂයේදී ද නොකඩවා ක්‍රියාත්මක වූණි. අලෙවිකරණ පහසුකම් සැපයීමට, අනෙකුත් අපනයන බෝගවල තත්ත්වය වැඩි දියුණු කිරීමට සහ නිෂ්පාදකයන්ට ආදායමක් ලැබීම සහතික කිරීමට, කුළුබඩු හා ආශ්‍රිත බෝග වෙළඳ සංගමය 1995 වර්ෂය තුලදී පිහිටුවන ලදී. අතීතයේදී මෙන් තවදුරටත් ක්‍රමවත් ව්‍යාප්ති වැඩපිළිවෙලවල්, වැඩිදියුණු කළ රෝපණ ද්‍රව්‍ය සහ පහසුවෙන් ණය ලබා ගැනීමට ඇති හැකියාව මෙම අංශයේ දියුණුව සඳහා විය.

වී ඵලදාව වැඩිකිරීම මගින් ආහාර සුරක්ෂිතතාවයක් ඇති කිරීම ප්‍රධාන ප්‍රතිපත්තිමය අරමුණක් විය. තත්ත්වයෙන් ඉහළ බීජ සැපයීම, ඒකාබද්ධ පලිබෝධ කළමණාකරණය, පිරිවැය අඩු කිරීමට සහ ඵලදාව වැඩිකිරීමට, සෑජු පොහොර භාවිතය සහ මහ කන්නයේදී ඵලදායිතාව වැඩිකිරීම සඳහා දිගුකාලීන වී වර්ග භාවිතය යන කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී. කෙසේ වෙතත්, 1994 පසු භාගයේදී තිරිඟු පිටි සඳහා සහනාධාරයන් දීමේ ප්‍රතිපත්තිය 1995 වර්ෂය තුලදී තරමක් දුරට අඩු කලද වී වගා අංශයට මෙන්ම අතුරු ආහාර බෝග අංශයට ද අහිතකර ලෙස බලපෑවේය.

කල්ගත වූ ගොවි ණය, සියයට 25 ක් ගෙවීමේ පදනම මත කපා හැරීමට රජය තීරණය කරන ලදී. මේ මගින් අළුතින් කෘෂිකාර්මික ණය ලැබීමට එම ගොවීන් සුදුසුකම් ලැබිය.

ප්‍රධාන වශයෙන් රාජ්‍ය බැංකු දෙක හා දේශීය වාණිජ බැංකු මගින්, අඩු කරන ලද පොලී අනුපාතයන් මත කෘෂිකාර්මික අංශයට සහනදායී ණය නොකඩවා සපයන ලදී. ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිමූල්‍ය පහසුකම් නොසැපයූ අතර ඒ වෙනුවට පොලී සහනාධාරයක් රජය මගින් සපයනු ලැබිය.

## 3.3 අපනයන බෝග

### තේ

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය වරක් ලෝකයේ අතිවිශිෂ්ඨ ස්ථානයක් හිමිකරගෙන තිබුනද දීර්ඝ කාලයක් තිස්සේ විටින් විට විවිධ අර්බුදවලටද මුහුණ දුනි. දේශීය හා විදේශීය අයිතිය යටතේ පැවති වතු ජනසතු කිරීමත් සමඟ ගැටළු තවදුරටත් උග්‍රවිය. බ්‍රිතාන්‍යය ව්‍යාපාරික උනන්දුව කෙන්යාව, මලාවිය සහ ටැන්සානියාව වැනි අප්‍රිකානු රටවල් කෙරෙහි යොමුවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකා තේ කර්මාන්තයට විශේෂයෙන් කෙන්යාවේ තේ කර්මාන්තය සමඟ තියුණු තරඟයකට මුහුණ දීමට සිදුවිය. කෝපි ජනප්‍රිය හා පහසු පානයක් බවට පත්වීම, තේ මිල ගණන්වලට බලපෑ අතර එය තේ කර්මාන්තයේ ගැටළු සංකීර්ණ කිරීමට හේතුවිය. රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය නම් වූ රාජ්‍ය සංස්ථා දෙක යටතේවූ ජනසතු කරන ලද වතුවල කළමණාකරණය, පවතින තරඟකාරිත්වයට මුහුණදීම හා ඵලදාව ඉහළ නැංවීම යන නව අභියෝගයන්ට මුහුණදීමට තරම් ශක්තිමත් වූ බවක් පෙනෙන්නට නොතිබිණි. රජය වැවිලි කර්මාන්ත කළමණාකරණයට සෘජු ලෙස මැදිහත්වූයේ වාණිජමය සලකා බැලිම්වලට වඩා සමාජ දේශපාලන සලකා බැලීම් මත වේ. මෙම කළමණාකරණ කාලය තුල කැපී පෙනුණ ලක්ෂණයන් වූයේ විශාල මූල්‍යමය පාඩු ලැබීම, නාස්තිය, පිරිවැය ඉහල නැගීම සහ කාර්යක්ෂමතාවය අඩුවීමයි.

ඉන්දියාව සහ කෙන්යාව වැනි අනෙකුත් තරඟකරුවන් සමඟ සසඳ බලන කල, ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ ප්‍රගතිය අසතුටුදායකය. ඵලදාව සහ ශ්‍රම ඵලදායිත්වය පහත්ම මට්ටමක පවතින අතර තේ වල නිෂ්පාදන පිරිවැය ඉහළම මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ වැටුප් ඉහළ මට්ටමක පැවතුනද කම්කරුවකුගේ ඵලදායිත්වය ද අඩුම මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ වැවිලි අංශයේ වැටුප් මට්ටම් නිර්ණය කිරීම සහ ඵලදායිතා වර්ධනය අතර සම්බන්ධතාවයක් නො පවතී. වැඩිවන නිෂ්පාදන පිරිවැය සහ අයහපත් මිළගණන් හමුවේ තේ කර්මාන්තය සක්‍රියව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වූ ගැලපීම් කිරීමේදී අපනයන තීරුබදු ක්‍රමයෙන් අඩුකිරීමට සිදුවූ අතර අවසානයේ විනිමය අනුපාතිකයට එම පීඩනය දරා ගැනීමට සිදුවිය. වැවිලි කර්මාන්තයේ දිගින් දිගටම ඇතිවූ පාඩු, රජයේ නිර්දේශ මත ලබාගත් ණය මගින් මූල්‍යයනය කරන ලදී.

මෙවැනි අඩුපාඩු හේතුවෙන් 1992 දී රජය විසින් ප්‍රතිව්‍යුහකරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. ආරම්භයේදී, රාජ්‍ය අංශය සතු වතුවලින් විශාල ප්‍රමාණයක් කළමණාකරණය කිරීම පස් අවුරුදු ගිවිසුමක් මත පෞද්ගලික කළමණාකරණ සමාගම්වලට ලබාදෙන ලදී. බදු කාලසීමාව කෙටි කාලීන එකක් වීම සහ කළමණාකරණ සමාගම්වලට වතුවල හිමිකාරිත්වයක් නොතිබූ හෙයින් ප්‍රාග්ධන වියදම් මත ආයෝජනය කිරීම සඳහා දිරිගැන්වීමක් සිදු නොවිණි.

මේ නිසා රාජ්‍ය වතු කළමණාකරණය, බද්ද නැවත අළුත් කිරීමේ අයිතියද ඇතිව, අවුරුදු 50 ක කාලසීමාවක් සඳහා පෞද්ගලීකරණය කිරීමට 1995 වර්ෂයේදී රජය විසින් ඉතාමත් ධෛර්යමත් තීරණයක් ගනු ලැබිය.

1995 වර්ෂයේ තේ නිෂ්පාදනය, පසුගිය වර්ෂයේ වූ ඉහළම නිෂ්පාදනය සියයට 2 කින් අභිබවා යමින් කිලෝ ග්‍රෑම් දශලක්ෂ 246 ක් ලෙස වාර්තා විය. මෙසේ නිෂ්පාදනය වැඩිවීමට

යහපත් කාලගුණික තත්ත්වය විශාල වශයෙන් බලපෑ අතර, සමහර රාජ්‍ය වතුවල වැඩිදියුණු වූ කළමණාකරණය, කුඩා තේ වතු හිමියන්ගේ ඉහළ ඵලදායකත්වය සහ වර්ෂයේ අවසාන කාලයේ තේ සඳහා ආකර්ෂනීය මිල ගණන් පැවතීමද දායක විය. පහත් බිම් තේ නිෂ්පාදනය නොකඩවා තුන්වන වර්ෂයටත්, සියයට 3 කින් වැඩිවී මෙම වර්ෂයේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් දශලක්ෂ 122 බවට පත්විය. මෙය පහත්බිම් අංශයේ මෙතෙක් වාර්තා වී ඇති ඉහළම තේ නිෂ්පාදනය ලෙස වාර්තා වන අතර මුළු තේ නිෂ්පාදනයේ විශාලතම කොටසද වේ. නිෂ්පාදනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ නව වගාවන්හි හොඳ ඵලදාවක් ලබාදෙන ක්ලෝන සිටුවීමය. මැදිබිම් තේ නිෂ්පාදනය සියයට 7 කින් වැඩි වූ අතර උස්බිම් තේ නිෂ්පාදනය සියයට 4 කින් පහත වැටුණි.

## සංඛ්‍යා සටහන 3.2

## තේ වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1993 - 1995

| අයිතමය | ඒකකය | 1993 | 1994(අ) | 1995 (ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ. දශලක්ෂ | 232 | 242 | 246 |
| උස් බිම් | කි.ග්‍රෑ. දශලක්ෂ | 73 | 77 | 74 |
| මැදි බිම් | කි.ග්‍රෑ. දශලක්ෂ | 47 | 47 | 51 |
| පහත් බිම් | කි.ග්‍රෑ. දශලක්ෂ | 112 | 118 | 122 |
| 2. තේ වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය (ඇ) | හෙක්ටයාර දහස් | ල.නො. | 187 | 187 |
| 3. පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 147 | 126 | 120 |
| 4. නැවත වගා කිරීම් | හෙක්ටයාර | 1,311 | 1,225 | 1,274 |
| 5. මිල | | | | |
| කොළඹ (ශුද්ධ) | කි.ග්‍රෑ./රුපියල් | 68.88 | 65.12 | 72.21 |
| අපනයන (නැ.වි.ස.) | කි.ග්‍රෑ./රුපියල් | 91.16 | 91.32 | 102.31 |
| 6. නිෂ්පාදන පිරිවැය | කි.ග්‍රෑ./රුපියල් | 75.81 | 75.67 | 79.14 |
| 7. අපනයන | කි.ග්‍රෑ. දශලක්ෂ | 218 | 230 | 241 |
| 8. අපනයන ඉපැයුම් | රුපියල් දශලක්ෂ | 19,911 | 20,964 | 24,638 |
| | විගැහි දශලක්ෂ | 296 | 296 | 316 |
| 9. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඈ) | | 2.4 | 2.3 | 2.1 |

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) තේ කොමසාරිස් අංශය මගින් 1992 වර්ෂයේදී කරන ලද සමීක්ෂණයක දත්ත මත පදනම් වේ. (අත්හරින ලද තේ ඉඩම් ඇතුලත් නොවේ).
(ඈ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.


මෙහිදී විශේෂයෙන් සඳහන් කලයුතු වන්නේ හොඳින් සංවිධානය වූ රාජ්‍ය අයිතිය ඇති විශාල වතුවලට වඩා කුඩා වතු හිමියන් කාර්යක්ෂම නිෂ්පාදකයන් වන බවයි. කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් ප්‍රමාණය, මුළු තේ බිම් ප්‍රමාණයෙන් සියයට 45 ක් පමණ වුවත්, තේ දළු නිෂ්පාදනයෙන් සියයට 60 කට ආසන්න ප්‍රමාණයක් ඔවුන් විසින් නිපදවනු ලබයි. රත්නපුර, ගාල්ල හා මාතර දිස්ත්‍රික්කයන්හි පහත් බිම් ප්‍රදේශවල දළ වශයෙන් කුඩා තේ වතු හිමියන්ගෙන් සියයට 65 ක් පමණ ස්ථානගත වී ඇත.

පසු කාලයේදී, ශ්‍රී ලංකාව සම්ප්‍රදායික තේ නිෂ්පාදන ක්‍රමය වෙනුවට සී. ටී. සී. (කපා, ඉරා, අඹරණ ලද) තේ නිෂ්පාදන ක්‍රමය වෙත යොමුවීමට උත්සාහ කරන ලදී. මෙම නව ක්‍රමය යටතේ නිෂ්පාදිත තේ මගින් ඉක්මනින් පානීය තේ සකස්කළ හැකි අතර, එම තේ වෙළඳපොලේ ජනප්‍රිය වෙමින් පවතී. 1994 වර්ෂයේ සියයට 41 ක වැඩිවීමක් වාර්තා කළ සී.ටී.සී. තේ නිෂ්පාදනය, 1995 වර්ෂයේ තවදුරටත් සියයට 77 කින් පුළුල් වෙමින් කිලෝග්‍රෑම් දශලක්ෂ 20 ක් විය. මේ අනුව 1994 වර්ෂයේ මුළු නිෂ්පාදනයෙන් සියයට 4 ක් වූ සී.ටී.සී. තේ නිෂ්පාදනය මෙම වර්ෂයේ සියයට 8 ක් ලෙස ගණනය කර ඇත. එළිතින් සී.ටී.සී. තේ කම්හල්තශාලා ඉදිකිරීම හා සම්ප්‍රදායික තේ කම්හල්තශාලා සී.ටී.සී. තේ කම්හල්තශාලා බවට පරිවර්තනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1995 වර්ෂයේ සී.ටී.සී. තේ කම්හල්තශාලා ප්‍රමාණය 25 සිට 33 දක්වා වැඩිවිය.

1995 වර්ෂයේ නිමි තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය, වැටුප් සහ පොහොර මිල වැඩිවීම හේතුවෙන් සියයට 5 කින් වැඩිවී රුපියල් 79.14 ක් විය. කෙසේ වෙතත්, කොළඹ තේ වෙන්දේසියේ තේ වලට ලැබුණ සාමාන්‍ය මිල නොකඩවා පස්වන වර්ෂයටත් නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවිය. බොහොමයක් කම්හල්තශාලා හිමියන් කාලාන්තරයක් තිස්සේ සැණ නිෂ්පාදන ආන්තිකයකට මුහුණදීම හේතුවෙන්, කම්හල්තය සමස්තයක් වශයෙන් ගත් කල විශාල ද්‍රවශීලතා අර්බුදයකට මුහුණ පා ඇත. පෞද්ගලික තේ කම්හල්තශාලා හිමියන් සහ කළමණාකරණ සමාගම් කීපයක් බැංකුවලින් විශාල වශයෙන් ණය ලබාගැනීම නිසා කර්මාන්තයේ රැඳී සිටීමට හැකියාව ලදහ.

කෙසේ වෙතත්, 1995 වර්ෂයේ පසු භාගයේදී කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය තේ මිල වැඩිවෙමින් යථා තත්ත්වයට පත්විය. මෙයට හේතුවූයේ, ඉන්දියාවේ දේශීය පරිභෝජනය ඉහළ යෑම නිසා අපනයනය කල හැකි තේ අතිරික්තය අඩුවීම මෙන්ම, ස්වාධීන පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් (පෙර සෝවියට් සමූහාණ්ඩුව) හා සමහරක් මැද පෙරදිග රටවල් කොළඹ තේ වෙන්දේසියේ කටයුතුවලදී දක්වන ලද ක්‍රියාකාරී සහභාගිත්වයයි. ඇමරිකා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ නාමික අගය පහත වැටීම ද තේ වලට තරඟකාරිත්වයක් ඇතිවීමට හේතුවිය. 1995 වර්ෂයේදී කොළඹ තේ වෙන්දේසියේ තේවල සාමාන්‍ය වාර්ෂික මිල සියයට 11 කින් වැඩි වී කිලෝග්‍රෑමයකට රුපියල් 72.21 ක් වූ අතර සාමාන්‍ය අපනයන මිලද සියයට 12 කින් වර්ධනය වී කිලෝග්‍රෑමයට රුපියල් 102.31 ක් විය.

රූප සටහන 3.1
මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක: තේ
(1990 = 100)




මූලයමය දුෂ්කරතාවයන් හේතුවෙන්, 1995 වර්ෂය තුලදී තේ වගා අංශය භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 5 කින් පහළ වැටී මෙට්‍රික් ටොන් 120,300 ක් විය. තේ අංශයේ පොහොර යෙදීම අඩුවීම බොහෝදුරට වගා හිමියන් මුහුණ

දුන් මූල්‍ය අර්බුදයේ ප්‍රතිඵලයක් වූ අතර එය දිගුකාලීන වශයෙන් ඵලදායිතාවයට අහිතකර ලෙස බලපෑ හැකිය. දැනුදු, ශ්‍රී ලංකාවේ තේ ඵලදායිතාවය සිය තරඟකරුවන්ගේ ඵලදායිතාවයට වඩා පහත් මට්ටමක පවතී.

පසුගිය වර්ෂයේ දී මෙන්ම, සියළුම තේ වගා අංශ සඳහා දෙනු ලබන නව වගා සහනාධාර මුදල හෙක්ටයාරයකට රුපියල් 36,000 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. නැවත වගා සහනාධාර අනුපාතයද උස්බිම් හා මැදි බිම් අංශ සඳහා හෙක්ටයාරයකට රුපියල් 67,000 ක් හා පහත් බිම් අංශය සඳහා හෙක්ටයාරයකට රුපියල් 57,000 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. නැවත වගා සහනාධාරය මගින් ආවරණය කරනු ලබන්නේ මුළු නැවත වගා වියදමෙන් සියයට 25 ක් පමණි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් 1995 වර්ෂය තුලදී මුදාහරින ලද මුළු නැවත වගා සහ නව වගා සහනාධාර ප්‍රමාණය, 1994 වර්ෂයේ ප්‍රමාණයට වඩා සුළු වශයෙන් වැඩි වී රුපියල් දශලක්ෂ 76 ක් විය.

වගා සහනාධාර වලට අමතරව, රජය කර්මාන්තශාලා නවීකරණය සඳහා සහායවීමද නොකඩවා සිදුකරන ලදී. 1995 වර්ෂය තුලදී තේ කම්හල් සංවර්ධන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සහ සී.ටී.සී. යන්ත්‍ර සඳහා දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය නොකඩවා ක්‍රියාත්මක විය. දේශීය එකතු කළ අගය වැඩි කරන ලද තේ නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා තේ බෑග් සෑදීමේ යන්ත්‍ර මිලදී ගැනීම් මත ගෙවනු ලැබූ සියයට 50 ක පොලී සහනාධාරය සියයට 75 දක්වා වැඩි කරන ලදී. මෙම සහනාධාර ලබාදීම සඳහා අරමුදල් ලබාදෙන ලද්දේ කර්මාන්තයේ සෙස් බද්ද මගිනි. 1995 වර්ෂයේදී තේ සඳහා වූ සෙස්බද්ද, කිලෝ ග්‍රෑමයට රුපියල් 2 ක් වශයෙන් නොවෙනස්ව පැවතිණි. සෙස් බද්ද මගින් ලැබුණු ආදායම පසුගිය වර්ෂයට වඩා සියයට 2 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 477 ක් විය.

## රබර්

1995 වර්ෂය තුලදී, ස්වාභාවික රබර් මිල ගණන් වාර්තාගත මට්ටම් කරා ලඟාවීමත් සමඟ දේශීය රබර් කර්මාන්තය උත්පාත තත්ත්වයක් අත් දකින ලදී. කෙසේ වෙතත්, රබර් නිෂ්පාදනය බොහෝ දුරට නොවෙනස්ව පැවතීම නිසා මෙහි වාසිය රටට ලබාගැනීමට හැකිවූයේ සුළු වශයෙනි. මේ අතර, විශේෂයෙන් කම්කරුවන්ගේ හිඟය නිසා වැටුප් ඉහළ යාම පිරිවැය තියුණු ලෙස වැඩිවීමට හේතුවුණි.

1995 වර්ෂයේ රබර් මිල ගණන් වාර්තාගත මට්ටමකට ලඟා වූවද, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් දශලක්ෂ 105.7 ක් වශයෙන් සියයට 0.4 ක සුළු වැඩිවීමක් පමණක් පෙන්විය. මුළු නිෂ්පාදනයෙන් විශාලතම කොටසට දායක වන ෂීට් රබර් නිෂ්පාදනය, සියයට 3 කින් වැඩිවී කිලෝ ග්‍රෑම් දශලක්ෂ 42 ක් විය. තාක්ෂණිකව විශේෂණය කරන ලද රබර් නිෂ්පාදනය දෙගුණයටත් වඩා වැඩිවීමක් පෙන්නුම් කරමින් කිලෝ ග්‍රෑම් දශලක්ෂ 23 ක් විය. එනමුත් 1995 වර්ෂයේදී ක්‍රේප් රබර් නිෂ්පාදනය සියයට 9 කින් පහත වැටී කිලෝ ග්‍රෑම් දශලක්ෂ 35 ක් විය.

1995 වර්ෂයේදී කිරි කැපීම යටතේ ඇති බිම් ප්‍රමාණය සියයට 2 කින් වැඩි වී හෙක්ටයාර 123,900 ක් වූ අතර, හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව සියයට 2 කින් පහත වැටී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 853 ක් විය. අඩු පොහොර භාවිතය,

**සංඛ්‍යා සටහන 3.3**

### රබර් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1993-1995

| අයිතමය | ඒකකය | 1993 | 1994(අ) | 1995(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ. දශලක්ෂ | 104 | 105 | 106 |
| 2. බිම් ප්‍රමාණය (ඇ) | | | | |
| වගාව යටතේ ඇති | හෙක්ටයාර දහස් | 162 | 161 | 162 |
| කිරි කැපීම යටතේ ඇති | හෙක්ටයාර දහස් | 119 | 121 | 124 |
| 3. ඵලදාව | හෙක්ටයාරයකට කි.ග්‍රෑ. | 873 | 870 | 853 |
| 4. පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 18 | 17 | 15 |
| 5. නැවත වගා කිරීම් | හෙක්ටයාර | 2,419 | 1,623 | 2,100 |
| 6. මිල | | | | |
| කොළඹ (ආර්.එස්.එස් නො.1) | කි.ග්‍රෑ./රුපියල් | 35.48 | 50.36 | 72.04 |
| අපනයනය (නැ.වි.ස) | කි.ග්‍රෑ./රුපියල් | 44.34 | 51.81 | 83.69 |
| 7. නිෂ්පාදන පිරිවැය (ඈ) | කි.ග්‍රෑ./රුපියල් | 23.00 | 24.90 | 26.50 |
| 8. අපනයන | කි.ග්‍රෑ. දශලක්ෂ | 70 | 69 | 68 |
| 9. දේශීය පරිභෝජනය | කි.ග්‍රෑ. දශලක්ෂ | 33 | 36 | 37 |
| 10. අපනයන ඉපැයීම් | රු. දශලක්ෂ | 3,086 | 3,582 | 5,713 |
| | විගැහි දශලක්ෂ | 46 | 51 | 74 |
| 11. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.7 | 0.9 | 0.8 |

මූලයන්: රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව


(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) කෘෂිකාර්මික බෝග සහ පශු සමීක්ෂණය -1993 මත පදනම් වේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
(ඈ) කුඩා වතුහිමියන්ගේ පමණි.
(ඉ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

බොහොමයක් රබර් වගාවන් වයස්ගත ඒවා වීම හා සාපේක්ෂ වශයෙන් ඵලදාව අඩු ක්ලෝන වලින් රබර් වගාව සමන්විත වීම, වැඩි වශයෙන් කිරි කපන කාලවලදී වර්ෂාපතනයෙන් බාධා ඇතිවීම සහ පලපුරුදු කිරි කපන්නන්ගේ හිඟය යන හේතූන් ඵලදාව අඩුවීමට හා නිෂ්පාදනය වර්ධනය නොවීමට හේතුවිය.

රබර් වගාව ප්‍රධාන වශයෙන් කුඩා වතු හිමියන්ගේ වගාවක් වන අතර,පෞද්ගලික අංශයේ කුඩා වතු හිමියන් රබර් ඉඩම් ප්‍රමාණයෙන් සියයට 64 ක් හිමි කර ගනී. වැඩිවූ මිල ගණන් වයස්ගත රබර් ගස් නැවත වගාකිරීම සඳහා යම් දිරිදීමක් සපයනු ලැබිය. වර්ෂය තුලදී හෙක්ටයාර 2,100 ක පමණ බිම් ප්‍රමාණයක රබර් නැවත වගා කරන ලද අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 29 ක වැඩිවීමකි. කෙසේ වෙතත්, 1995 වර්ෂය තුලදී, අළුතින් රබර් වගාකරන ලද බිම් ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර 553 දක්වා සියයට 17 කින් පහළ වැටුණි. මෙයට රබර් පැලවල හිඟය සුළු වශයෙන් හේතුවිය. නැවත වගාව සඳහා දෙනු ලැබූ සහනාධාර ප්‍රමාණය හෙක්ටයාරයකට රුපියල් 37,065 සිට හෙක්ටයාරයකට රුපියල් 49,722 දක්වා සහ නව වගාව සඳහා දෙනු ලැබූ සහනාධාර ප්‍රමාණය හෙක්ටයාරයට රුපියල් 35,830 සිට හෙක්ටයාරයකට රුපියල් 48,185 ක් දක්වා වැඩිවිය. ප්‍රධාන වශයෙන්, මෙම පුළුල් වූ ගෙවීම් වලින් වාසි ලබාගන්නා ලද්දේ කුඩා ඉඩම් හිමියන් ය. 1988 වර්ෂයේ ලෝක බැංකු ආධාර මත ආරම්භ වූ, රබර් පුනරුත්ථාපන ව්‍යාපෘති පිළිවෙලෙහි ක්‍රියාකාරීත්වය සතුටුදායක නොවිය. 1995 වර්ෂයේ මේ මගින් කළුතර, කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල හෙක්ටයාර 3,430 ක රබර් නැවත වගා කිරීමට ඉලක්ක කලද, ඇත්ත වශයෙන්ම නැවත වගාකිරීම් කරනු ලැබුයේ හෙක්ටයාර 1,329 ක පමණි. මෙම ව්‍යාපෘති පිළිවෙල

මගින් 1996 ජූලි මාසය වන විට හෙක්ටයාර 30,000 ක් නැවත වගාකිරීමට හා හෙක්ටයාර 8,750 ක නව වගා කිරීමට අපේක්ෂා කලද ව්‍යාපෘතියට පසුගිය වසර හත තුළ ලඟාකරගත හැකිවූයේ බලාපොරොත්තු වූ ප්‍රමාණයෙන් සියයට 50 ක අනුපාතයක් පමණි. බොහෝ කාලයක් රබර් සඳහා හොඳ මිල ගණන් නොපැවතිම හේතුවෙන් පෞද්ගලික අංශයේ නවාත් හිමියන් බීජ රෝපණ තොග වැඩි කිරීමට උනන්දුවූයේ සුළු වශයෙනි. මීට අමතරව, නියමිත කාලසීමාවලදී තද වැසි පැවතීමද බීජ අවශ්‍යතා තොග අඩුවීමට හේතුවිය.

**රූප සටහන 3.2**
**මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක : රබර්**
**(1990 = 100)**




විශාල රබර් වගාවන්හි සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය සියයට 32 කින් වැඩි වී කිලෝග්‍රෑම් එකකට රුපියල් 50.56 ක් වූ බව ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත් කුඩා වතු හිමියන්ගේ අංශයේ, 1995 වර්ෂයේ නිෂ්පාදන පිරිවැය සියයට 6 කින් පමණක් වැඩි වී කිලෝග්‍රෑමයට රුපියල් 26.50 ක් විය. විශේෂයෙන්ම කිරි කපන්නන්ගේ හිඟය නිසා වැටුප් ඉහළයාම සහ පොහොර සඳහා යන වියදම වැඩිවීම නිසා යෙදවුම්වල මිල ගණන් ඉහළ යාම නිෂ්පාදන පිරිවැය ඉහළයාමට හේතු විය. මෙහිදී සඳහන් කල යුතු කරුණක් වන්නේ කුඩා ඉඩම්වල සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය, විශාල ඉඩම්වල සාමාන්‍ය නිෂ්පාදන පිරිවැයෙන් අඩක් වීමයි.

1995 වර්ෂයේදී රබර් සඳහා මිල උත්පාතයක් පැවතිණි. කොළඹ වෙන්දේසියේ ආර්. ඇස්.ඇස්. නො. 1 රබර් කිලෝග්‍රෑම් එකක වාර්ෂික සාමාන්‍ය මිල කිලෝග්‍රෑමයකට රුපියල් 72.04 දක්වා සියයට 43 කින් වැඩි විය. සියළුම රබර් වර්ගවල සාමාන්‍ය අපනයන මිල සියයට 62 කින් වර්ධනය වී කිලෝග්‍රෑම් එකකට රුපියල් 83.69 ක් කරා ළඟාවිය. මේ නිසා, 1995 වර්ෂය තුල මුළු අපනයන ප්‍රමාණය කිලෝග්‍රෑම් දශලක්ෂ 68 ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණද, අපනයන ආදායම සියයට 59 කටත් වඩා වැඩි වී රුපියල් දශලක්ෂ 5,713 ක් විය.

1995 වර්ෂය තුලදී, විශේෂයෙන් මුල් මාස 9 තුලදී ජාත්‍යන්තර වෙළෙඳපොලේ ස්වභාවික රබර් සඳහා වන ඉල්ලුම තියුණු ලෙස ඉහළ නැගුණ අතර මෙම ඉල්ලුමේ වර්ධනයට, ටයර් කර්මාන්ත අංශයේ ඉල්ලුම වැඩිවීම සහ කෘතිම රබර් අංශයේ පැවති ධාරිතාවය සීමාවීම හේතුවිය. මලයාසියාවේ රබර් නිෂ්පාදනය අඩුවීමද තවදුරටත් රබර් මිල ඉහළ මට්ටමක පැවතීමට හේතුවිය. දේශීය රබර් ආශ්‍රිත නිෂ්පාදන අංශයේ කැපී පෙනෙන වර්ධනයත් සමඟ නොකඩවා එකොලොස් වන වර්ෂයටත් දේශීය රබර් පරිභෝජනයද පැහැදිලි වැඩිවීමක් පෙන්නුම් කලේය. 1995 වර්ෂයේ දේශීය රබර් පරිභෝජනය සියයට 3 කින් වර්ධනය වී කිලෝග්‍රෑම් දශලක්ෂ 37 ක් වූ අතර එය දේශීය රබර් නිෂ්පාදනයෙන් 1/3 කට සමාන විය. නුදුරු අනාගතයේ ස්වභාවික රබර් සඳහා වන ඉල්ලුම ඉහල මට්ටමක පවතිනු ඇත. 1995 වර්ෂයේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වැසි කාලයේ කිරිකැපීමට පහසුවන ආකාරයෙන් වැසි ආවරණ සවිකිරීම හා සම්පූර්ණයෙන් වැඩුණ ගස් සඳහා පොහොර යෙදීම දිරි ගැන්වීමේ යෝජනාක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

1995 පෙබරවාරි මස 01 දින සිට රබර් නැවත සිටුවීම සඳහා වූ අරමුදල තර කිරීම සඳහා ෂීට් සහ ක්‍රේප් රබර් මත වන රබර් නැවත වගා සෙස් බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 1.15 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 3.85 දක්වා වැඩිකරන ලදී. 1995 ජූලි මස 01 දින සිට අනෙකුත් අපනයනය කරනු ලබන රබර් වර්ග සඳහාද සෙස් බද්ද ව්‍යාප්ත කරන ලදී. මෙම සෙස් බද්ද යටතේ රැස් කරන ලද බදු මුදල් නැවත වගා සහනාධාර වශයෙන් රබර් වගා අංශය සඳහා යොදවනු ලබයි.

## පොල්

1995 වර්ෂයේ පොල් නිෂ්පාදනය ගෙඩි දශලක්ෂ 2,755 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, මෙය පසුගිය වර්ෂයේ නිෂ්පාදන මට්ටම සියයට 5 කින් අභිබවා යාමකි. මෙය 1986 න් පසුව වාර්තා වූ ඉහළම නිෂ්පාදන මට්ටම විය. නිෂ්පාදනය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පසුගිය වසර දෙක තුල පැවති යහපත් කාලගුණික තත්ත්වයේ පසු කාලීන බලපෑම සහ පොහොර භාවිතය ඉහළ යාමයි. දිනපතා ආහාරයෙහි ප්‍රධාන අංගයක් වන පොල්වල දේශීය මිල බලාපොරොත්තු වූ අයුරින්ම, සුළු වශයෙන් පහළ වැටුණි. ප්‍රධාන පොල්මඳ නිෂ්පාදනයන්හි ලෝක වෙළඳපල මිල ගණන්, නිෂ්පාදන අවිනිශ්චිතතාවයක් හේතුවෙන් ඉහළ මට්ටමක පැවතිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පොල්මඳ නිෂ්පාදනයන් මගින් ලැබූ අපනයන ආදායම සියයට 42 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 3,521 ක් (විගැහි වටිනාකමෙන් ගත් කල සියයට 29 කින්) විය.

සාමාන්‍යයෙන් සැපයුම ඉහළ යෑම නිසා ගෙඩි පොල් මිල පහත වැටෙන විට, වෙනත් පොල් මඳ නිෂ්පාදිත වලට වඩා, ඉහළ ලාභ ආන්තික සහිත කපාපු පොල් නිෂ්පාදනය සඳහා වැඩිපුර පොල් යොදා ගැනේ. 1995 වර්ෂය තුලදී කපාපුපොල්, කොප්පරා සහ පොල්තෙල්වල ජාත්‍යන්තර මිල ගණන්ද ඉහළ නැගුණි. මේ අනුව, කපාපු පොල් නිෂ්පාදනයේ ගෙඩි සමානය, සියයට 22 කින් වැඩිවී ගෙඩි දශලක්ෂ 465 ක් විය. මෙය 1986 සිට වාර්තා වූ ඉහළම නිෂ්පාදන මට්ටම විය. පොල්තෙල් නිෂ්පාදනයේ ගෙඩි සමානය, සියයට 12 කින් වර්ධනය වී ගෙඩි දශලක්ෂ 540 ක් වූ අතර කොප්පරා අපනයනයේ ගෙඩි සාමානය, සියයට 52 කින් වැඩි වී ගෙඩි දශලක්ෂ 49 ක් විය. 1995 වර්ෂයේ ගෙඩිපොල් අපනයනය, ගෙඩි දශලක්ෂ 25 ක් වශයෙන් පසුගිය වර්ෂයේ පැවති මට්ටමේම නොවෙනස්ව පැවතිණි. දේශීය පොල් ගෙඩි පරිභෝජනය, සුළු වශයෙන් වර්ධනය වී ගෙඩි දශලක්ෂ 1,692 ක් වූ අතර, එය ජාතික නිෂ්පාදනයෙන් සියයට 61 ක් විය.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ඇස්තමේන්තුවලට අනුව 1995 වර්ෂයේ පොල් වගාව යටතේ තිබූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 413,000 කට ආසන්න වූ අතර, එයින් හෙක්ටයාර 1,235 ක් වර්ෂය තුලදී අළුතින් වගා කෙරුණි. මොණරාගල දිස්ත්‍රික්කයේ, දකුණු පලාතේ සහ මහවැලි 'සී' කලාපයේ ප්‍රදේශ පොල් වගාව සඳහා අළුතින් යොදා ගෙන ඇත. ඒ අතරම, පොල් ඉඩම් නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගැනීම හේතුවෙන් නගරාසන්න ප්‍රදේශවල පොල් වගාවේ අඩුවීමක් සිදුවිය. 1994 වර්ෂයේ සාමාන්‍ය ඵලදාව වූ හෙක්ටයාරයකට ගෙඩි 6,368 සමඟ සසඳ බලන කල, 1995 වර්ෂයේදී සාමාන්‍ය ඵලදාව සියයට 5 කින් වැඩිවී හෙක්ටයාරයකට ගෙඩි 6,671 ක් විය. 1995 වර්ෂයේ පොහොර භාවිතය සියයට 8 කින් වැඩිවීම ඵලදාව වැඩිවීමට තරමක් දුරට හේතුවිය.

**3.4 සංඛ්‍යා සටහන**

## පොල් වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1993 - 1995

| අයිතමය | ඒකකය | 1993 | 1994(අ) | 1995(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය (ඇ) | ගෙඩි දශලක්ෂ | 2,164 | 2,622 | 2,755 |
| කපාපු පොල් | ගෙඩි දශලක්ෂ(ඈ) | 269 | 380 | 465 |
| පොල් තෙල් | ගෙඩි දශලක්ෂ(ඈ) | 176 | 480 | 540 |
| කොප්පරා (ඉ) | ගෙඩි දශලක්ෂ(ඈ) | 24 | 32 | 49 |
| පොල් ගෙඩි අපනයනය | ගෙඩි දශලක්ෂ | 22 | 25 | 25 |
| දේශීය පොල් ගෙඩි පරිභෝජනය (ඊ) | ගෙඩි දශලක්ෂ | 1,668 | 1,687 | 1,693 |
| 2. මුළු වගාබිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 411 | 412 | 413 |
| 3. සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.) (උ) | ගෙඩිය/රුපියල් | 6.31 | 5.67 | 6.08 |
| 4. පොහොර භාවිතය | මෙ.ටො. දහස් | 35 | 31 | 34 |
| 5. නිෂ්පාදන පිරිවැය | ගෙඩිය/රුපියල් | 2.03 | 1.84 | 1.97 |
| 6. නැවත වගාව / යටි වගාව (ඌ) | හෙක්ටයාර | 1,553 | 842 | 917 |
| 7. නව වගාව (ඌ) | හෙක්ටයාර | 452 | 657 | 1,235 |
| 8. අපනයන ඉපැයුම් | රුපියල් දශලක්ෂ | 2,796 | 3,761 | 5,271 |
| | විගැහි දශලක්ෂ | 41 | 53 | 68 |
| මද ආශ්‍රිත නිෂ්පාදන(උ) | රුපියල් දශලක්ෂ | 1,847 | 2,476 | 3,521 |
| | විගැහි දශලක්ෂ | 27 | 35 | 45 |
| අනෙකුත් නිෂ්පාදන | රුපියල් දශලක්ෂ | 949 | 1,285 | 1,750 |
| | විගැහි දශලක්ෂ | 14 | 18 | 23 |
| 5. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (එ) | | 2.6 | 2.4 | 2.1 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) ගණනය කරන ලද්දකි. (කොප්පරා තොග වෙනස්වීම සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසදේ.)
(ඈ) ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේදී යොදාගත් අනුපාතිකයන්:

| | | |
|---|---|---|
| කපාපු පොල් | මෙ. ටො. | 1= ගෙඩි 6,800 |
| පොල් තෙල් | මෙ. ටො. | 1= ගෙඩි 8,000 සහ |
| කොප්පරා | මෙ. ටො. | 1= ගෙඩි 4,925 |


(ඉ) අපනයන පමණි.
(ඊ) ඒකපුද්ගල වාර්ෂික ගෘහ පරිභෝජනය පොල් ගෙඩි 94.8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනයට ගැනෙන පොල් ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුළත් නොවේ.
(උ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.
(ඌ) විස්තරාත්මක තොරතුරු ලබාගත නොහැකි බැවින් හෙක්ටයාර 0.4 ට අඩු කුඩා පොල් ඉඩම්වල කරගෙන යනු ලබන වගා කටයුතු පිළිබඳ විස්තර මෙයට ඇතුළත් නොවේ.
(එ) වගාකිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

1995 වර්ෂය තුලදී, නව වගා සහ නැවත වගා (සම්පූර්ණයෙන් ගස් ඉවත් කර) සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 25,000 ක් ද, නැවත වගා සහනාධාරය (ක්‍රමිකව ගස් ඉවත්කර) හෙක්ටයාරයකට රුපියල් 12,500 ක්ද, තෙතමනය සංරක්ෂණය සඳහා හෙක්ටයාරයකට රුපියල් 7500 ක් ද, අතුරු වගා සහනාධාරය ලෙස හෙක්ටයාරයකට රුපියල් 10,000 ක්ද වශයෙන් පොල් වගා සහනාධාර නොවෙනස්ව පැවතිණ. 1995 වර්ෂය තුලදී නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 9 කින් වැඩිවී හෙක්ටයාර 917 ක් වූ අතර, අලුතින් වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 88 කින් වැඩිවී හෙක්ටයාර 1,235 ක් විය. තෙතමන සංරක්ෂණය කල බිම් ප්‍රමාණය සියයට 14 කින් වැඩිවී හෙක්ටයාර 1,212 ක් වූ අතර අතුරු වගා කරනලද බිම් ප්‍රමාණය සියයට 41 කින් වැඩිවී හෙක්ටයාර 1,188 ක් විය.

1995 වර්ෂයේ සැපයුම වැඩිවීම කොළඹ වෙළඳපොළේ පොල් ගෙඩියක සාමාන්‍ය තොග මිල ගෙඩියකට රුපියල් 3.52 දක්වා සියයට 4 කින් අඩුවීමට හේතුවිය. කෙසේ වෙතත්, ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුනෙහි සාමාන්‍ය අපනයන මිල සියයට 7 කින් වැඩි වී, 1995 වර්ෂයේ දී ගෙඩියකට රුපියල් 6.08 ක් විය. වර්ෂයේ අග භාගයේදී පිලිපීනයේ පොල් නිෂ්පාදිත සැපයුම අඩුවීම හේතුවෙන් සියලු පොල් මද නිෂ්පාදන සඳහා විශේෂයෙන් කොප්පරා සහ පොල්තෙල් සඳහා ලෝක වෙළඳපල ඉල්ලුම ඉහලයාම මෙයට හේතු විය.

1995 වර්ෂයේ පොල් මද නිෂ්පාදිත වලින් ලැබූ අපනයන ආදායම විගැහි වටිනාකම් අනුව සියයට 29 කින් ඉහල නැගුණි.

රූප සටහන 3.3
මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක : පොල්
(1990 = 100)




පිටි කල පොල්කිරි වැනි අනෙකුත් පොල් නිෂ්පාදිත අපනයන ආදායමද සියයට 28 කින් ඉහළ නැගුණි.

මේ අතර වැටුප් වැඩිවීම සහ පොහොර මිල ගණන් ඉහලයාම නිසා පොල් ගෙඩියක නිෂ්පාදන පිරිවැය සියයට 7 කින් වැඩිවී ගෙඩියකට රුපියල් 1.97 ක් විය.

1993 වර්ෂයේ පොල් සංවර්ධන අධිකාරිය මගින් හඳුන්වාදෙනු ලැබූ කපාපු පොල් කම්හල් ශාලාවල අඛණ්ඩ වියලීමේ ක්‍රමයක් ඇතිකිරීමට අවශ්‍ය උපකාරක ද්‍රව්‍ය සවිකිරීම සඳහා ලබාදෙන මූල්‍යමය ආධාර යෝජනා ක්‍රමය 1995 වර්ෂයේ දී ද නොකඩවා ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය 1997 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කිරීමට ඇමති මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. කපාපු පොල් මෝල් සංවර්ධන වැඩ සටහන

යටතේ, කපාපු පොල් මෝල් හිමියන්ට කර්මාන්තශාලාවල යන්ත්‍ර පිරිවැයෙන් සියයට 40 ක් සහනාධාර වශයෙන් ලබාදුන් අතර, එය කර්මාන්තශාලා එකක් සඳහා රුපියල් දශලක්ෂ 3 ක උපරිමයකට යටත් වේ. 1995 වර්ෂය තුලදී මෙම වැඩ පිළිවෙල යටතේ මෝල් හිමියන් 15 දෙනෙකුට රුපියල් දශලක්ෂ 7 ක් ලබා දී ඇත.

1995 වර්ෂයේ දී පොල් වගාකරුවන්ගේ සමූපකාර සංගම් පිහිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ විය. මේ යටතේ වර්ෂය අවසාන වන විට එවැනි සංගම් 25 ක් පිහිටුවා තිබුණි. කුඩා වතු හිමියන් අතර පොහොර භාවිතය ප්‍රචලිත කිරීමේ අරමුණෙන් පොල් වගාකිරීමේ මණ්ඩලය පොල් පොහොර කිලෝ ග්‍රෑම් 5 ක මලු අලුතින් හඳුන්වා දුනි.

උසස් තත්ත්වයේ පොල් බීජ භාවිතය වර්ධනය කිරීමේ අරමුණෙන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ඇතිව බීජ සහතික කිරීමේ ව්‍යාපෘතියක් හඳුන්වාදෙන ලදී. විශේෂයෙන් පොල් ත්‍රිකෝණයෙන් පිටස්තර ප්‍රදේශයන්හි පොල් වගාව නංවාලීමේ අරමුණෙන්, පොල් වගාකිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය හා එක්ව පර්යේෂණ අනු මධ්‍යස්ථානයක් හා බීජ උද්‍යානයක් දකුණු පලාතේ ඉදිකිරීමට සැලසුම් කර ඇත.

ඵලදායි ව්‍යාප්ති සේවයක් සහ හොඳ තත්ත්වයෙන් යුතු බීජ බෙදාදීම මගින් පොල් ඉඩම්වල ඵලදාව වැඩි කිරීම සඳහා, පස් අවුරුදු පොල් සංවර්ධන සැලැස්මක් (1995 - 1999) පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් දියත් කරන ලදී.

## අනෙකුත් අපනයන බෝග

කුරුඳු, පැහිරි සහ සාදික්කා හා වසාවාසි වැනි බෝගයන්හි නිෂ්පාදනයේ වැඩිවීමක්ද, කෝපි, ගම්මිරිස් සහ කරාබුනැටි වැනි බෝගයන්හි නිෂ්පාදනයේ අඩුවීමක්ද වාර්තා කරමින් අනෙකුත් අපනයන බෝග නිෂ්පාදනය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් දැක්විය. 1994 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 9,774 ක් වූ කුරුඳු පොතු නිෂ්පාදනය සමඟ සසඳන කල, මෙම වර්ෂය තුළ කුරුඳු පොතු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 11,056 දක්වා සියයට 13 කින් ඉහළ ගියේය. කුරුඳු නිෂ්පාදනයෙහි සැලකියයුතු වර්ධනයට හේතුවූයේ ආකර්ෂණීය මිල ගණන් පැවතීම හේතුවෙන් ගොවීන් විසින් වඩාත් දියුණු ක්‍රම යටතේ වගාවන් පවත්වාගෙන යාමය. තවද නැවත වගා කරන ලද හා පුනරුත්ථාපනය කරන ලද බිම් ප්‍රමාණයන්හි අස්වැන්න ලබාගැනීමද, නිෂ්පාදනයෙහි වර්ධනයට හේතුවිය. පැහිරි සහ සාදික්කා හා වසාවාසි නිෂ්පාදනය පිළිවෙලින් සියයට 20 කින් හා සියයට 5 කින් වැඩි විය.

1995 වර්ෂයේදී කෝපි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,800 දක්වා සියයට 51 කින් සැලකියයුතු ලෙස පහත වැටුණි. මල් හටගන්නා කාලය තුළ පැවති අහිතකර කාලගුණික තත්ත්වය මෙන්ම, 1993 හා 1994 වර්ෂයන්හි සාර්ථකව ඵල දැරීමෙන් කෝපි ගසෙහි ඇතිවූ භෞතික විඩාව කෝපි නිෂ්පාදනය පහත වැටීමට හේතු විය. 1995 වර්ෂය තුළ ගම්මිරිස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3,665 ක් විය. මෙය 1994 දී මෙට්‍රික් ටොන් 4,708 ක් වූ අස්වැන්න හා සසඳන විට සියයට 22 කින් පහත වැටීමකි. මේ අතර මෑත අතීතය තුළ අවරෝහණ උපනතියක් දැක්වූ කරාබුනැටි නිෂ්පාදනය 1995 වර්ෂයෙහිදී මෙට්‍රික් ටොන් 1,500 දක්වා සියයට 3 කින් තවදුරටත් පහත වැටුණි.

1995 වර්ෂය තුළදී අනෙකුත් අපනයන බෝග වගාවන් යටතේ වූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 69,442 දක්වා සියයට 1 කින් ඉහළ නැගුණි. කොකෝවා සහ ගම්මිරිස් වගාවන් යටතේ වූ බිම් ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර 8,511 සහ හෙක්ටයාර 12,092 දක්වා හෙක්ටයාර 440 කින් හා හෙක්ටයාර 480 කින් වැඩිවීම, 1995 වර්ෂය තුළ වගාකරන ලද බිම් ප්‍රමාණයෙහි කැපී පෙණුනු වර්ධනයට දායකවිය.

අපනයන කෘෂි බෝග ආධාර ක්‍රමය යටතේ 1994 වර්ෂය තුළ ලබාදුන් රුපියල් දශලක්ෂ 15 ක සහනාධාර ප්‍රමාණය හා සසඳන කල, 1995 දී රුපියල් දශලක්ෂ 18 ක ප්‍රමාණයක් ලබා දී ඇත. ගම්මිරිස් හා කුරුඳු නිෂ්පාදකයින් විසින් මෙම ප්‍රමාණයෙන් සියයට 71 ක් ලබාගෙන ඇත.

**සංඛ්‍යා සටහන 3.5**

**අනෙකුත් අපනයන භෝග නිෂ්පාදනයන්**

**1993 - 1995**

මෙට්‍රික් ටොන්

| බෝගය | 1993 | 1994 | 1995 (අ) | ප්‍රතිශතාත්මක වෙනස | |
|---|---|---|---|---|---|
| | | | | 1994 | 1995 |
| කෝපි | 2,012 | 3,687 | 1,800 | 83 | -51 |
| කොකෝවා | 1,051 | 1,463 | 1,542 | 39 | 5 |
| කුරුඳුපොතු | 9,498 | 9,774 | 11,056 | 3 | 13 |
| කුරුඳු තෙල් (කොළ) | 138 | 180 | 195 | 30 | 8 |
| ගම්මිරිස් | 4,734 | 4,708 | 3,665 | -1 | -22 |
| කරාබු නැටි | 1,550 | 1,551 | 1,500 | - | -3 |
| කරදමුංගු | 30 | 40 | 40 | 33 | - |
| සාදික්කා සහ වසාවාසි | 937 | 939 | 988 | - | 5 |
| පැහිරි | 140 | 150 | 180 | 7 | 20 |

(අ) තාවකාලික.

මූලය: අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

1995 වර්ෂයෙහිදී මූලික කෘෂිකාර්මික නිෂ්පාදන කීපයක ලෝක වෙළඳපොලෙහි මිල ගණන් වැඩිවී ඇත. කළු ගම්මිරිස් සඳහා 1995 දී ලෝක වෙළඳපොල මිල කිලෝග්‍රෑමයකට රුපියල් 139 දක්වා සියයට 39 කින් ඉහළ ගියේය. මෙය පසුගිය දශකය තුළ වාර්තාගත දෙවන ඉහළම මිල වේ. ගම්මිරිස් සඳහා වූ දේශීය ගොවිපල මිල ගණන් ද 1995 දී කිලෝග්‍රෑමයකට රුපියල් 111 ක් දක්වා සියයට 43 කින් ඉහළ ගියේය. එලෙසම කෝපි සඳහා සාමාන්‍ය වාර්ෂික ජාත්‍යන්තර මිල කිලෝග්‍රෑමයකට රුපියල් 150 දක්වා සියයට 15 කින් වැඩි වූ අතර කෝපි සඳහා ගොවිපල මිල ගණන් කිලෝග්‍රෑමයකට රුපියල් 98 දක්වා සියයට 25 කින් වැඩි විය. 1995 දී කරාබු නැටි සඳහා ගොවිපල මිල ගණන් කිලෝග්‍රෑමයකට රුපියල් 52 දක්වා සියයට 15 කින් වර්ධනය විය. මේ අතර කරදමුංගු සඳහා ගොවිපල සාමාන්‍ය වාර්ෂික මිල කිලෝග්‍රෑමයකට රුපියල් 337 දක්වා සියයට 2 කින් වැඩි වූ අතර 1995 දී කොකෝවා මිල කිලෝග්‍රෑමයකට රුපියල් 49 දක්වා සියයට 8 කින් අඩු විය.

1990 දී ආරම්භ වූ මැද රට බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය 1995 වර්ෂයේ දී ද ගොවීනට සහාය පිණිස නොකඩවා ක්‍රියාත්මක විය. 1995 වර්ෂය අවසන් වනවිට අනුමත කරන ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 586 ක් විය. මෙය රුපියල් දශලක්ෂ 650 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 90 ක් පමණ විය. ව්‍යාපෘතිය යටතේ ඉලක්ක කරන ලද හෙක්ටයාර 6,000 ක බිම් ප්‍රමාණය හා සසඳන කළ දැනට ලබාදී ඇති ණය ප්‍රමාණයෙන් හෙක්ටයාර 5,055 ක බිම් ප්‍රමාණයක් ආවරණය කර ඇත.


## 3.4 දේශීය කෘෂිකර්මය

### වී

1995 වර්ෂයේ වී නිෂ්පාදනය සියයට 5 කින් වැඩිවී මෙට්‍රික් ටොන් දශලක්ෂ 2.8 (බුසල් දශලක්ෂ 135) විය. මෙසේ අස්වැන්න වැඩිවීමට යල සහ මහ කන්න දෙකම දායක විය. මෙම අති විශාල නිෂ්පාදනය සඳහා යහපත් කාලගුණික තත්ත්වය, හෙක්ටයාරයකට යොදන ලද පොහොර ප්‍රමාණය ඉහළ යාම සහ කලට වේලාවට ණය පහසුකම් ලැබීම හේතු විය.

1994/95 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.76 ක් (බුසල් දශලක්ෂ 84) ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය මුළු වී නිෂ්පාදනයට සියයට 63 කින් පමණ දායක විය. පසුගිය මහ කන්නය සමඟ සසඳ බලන කල මෙය සියයට 5 ක වැඩිවීමක් පෙන්නුම් කල අතර 1983 සිට මෙතෙක් වාර්තා වී ඇති දෙවන ඉහළම මහ කන්නයේ නිෂ්පාදනය විය. පසුගිය මහ කන්නය සමඟ සසඳ බලන කල වගාකරන ලද සහ අස්වැන්න නෙලාගන්නා ලද බිම් ප්‍රමාණයන් අඩු වුවද, මහ කන්නයේ වී නිෂ්පාදනයේ සතුටුදායක ක්‍රියාකාරිත්වයට මූළුමනින් ම හේතු වූයේ ඵලදාව වැඩිවීමයි. නොකඩවා 8 වන වර්ෂයටත්, කුරුණෑගල දිස්ත්‍රික්කය මහ කන්නයේ ඉහළම නිෂ්පාදනය වාර්තා කල අතර, එය මෙට්‍රික් ටොන් 224,000 ක් හෙවත් මහ කන්නයේ මුළු නිෂ්පාදනයෙන් සියයට 13 ක් විය. කුරුණෑගල, අනුරාධපුරය, පොලොන්නරුව සහ අම්පාර යන දිස්ත්‍රික්ක සියල්ලෙහි වී නිෂ්පාදනය, මහ කන්නයේ මුළු නිෂ්පාදනයෙන් සියයට 45 කට දායක විය.

1995 යල කන්නයේ වී නිෂ්පාදනය, නොකඩවා තුන්වන වර්ෂයටත් වැඩිවීමක් පෙන්නුම් කල අතර, එය මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.05 ක් (බුසල් දශලක්ෂ 50 ක්) ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙය පසුගිය යල කන්නයේ නිෂ්පාදනයට වඩා සියයට 3 ක වැඩිවීමක් වාර්තා කලේය. මෙසේ යල කන්නයේ නිෂ්පාදනය වැඩිවීමට අස්වැන්න නෙලාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය වැඩිවීම මෙන්ම ඵලදාව වැඩිවීමද හේතුවිය. පසුගිය වර්ෂයේ මෙන්ම අම්පාර දිස්ත්‍රික්කය, යල කන්නයේ ඉහලම වී නිෂ්පාදනය වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 198,000 හෙවත් මුළු යල නිෂ්පාදනයෙන් පහෙන් එකක් නිෂ්පාදනය කර ඇත. අම්පාර, පොලොන්නරුව සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල යල කන්නයේ වී නිෂ්පාදනය, මුළු යල නිෂ්පාදනයෙන් සියයට 48 ක් විය.



රූපසටහන 3.4
වී නිෂ්පාදනය

1995 වර්ෂයේ හෙක්ටයාරයකින් ලැබුණු සාමාන්‍ය ඵලදාව පසුගිය වර්ෂයට වඩා සියයට 5 කින් වර්ධනය වී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,535 ක් විය. මෙය 1987 වර්ෂයේ සිට වාර්තා වී ඇති ඉහළම ඵලදාව විය. 1995 වර්ෂයේ

සංඛ්‍යා සටහන 3.6

**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා 1994 - 1995**

| අයිතමය | ඒකකය | 1994(අ) | | | 1995 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 581 | 349 | 930 | 566 | 348 | 915 |
| අස්වැන්න කපා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 561 | 336 | 897 | 549 | 340 | 890 |
| අස්වැන්න කපා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 499 | 299 | 798 | 489 | 306 | 795 |
| නිෂ්පාදනය | මෙ.ටො. දහස් | 1,670 | 1,014 | 2,684 | 1,761 | 1,049 | 2,810 |
| | බුසල් දහස් | 80,054 | 48,616 | 128,670 | 84,407 | 50,271 | 134,678 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයකට කි.ග්‍රෑ. | 3,345 | 3,393 | 3,363 | 3,603 | 3,427 | 3,535 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් දශලක්ෂ | 453 | 207 | 660 | 570 | 236 | 806 |
| සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගැනීම් | මෙ.ටො. දහස් | 69 | 51 | 120 | 197 | 85 | 282 |
| සහල් ආනයන | මෙ.ටො. දහස් | - | - | 58 | - | - | 9 |
| (වී සමානය) | (මෙ.ටො. දහස්) | (-) | (-) | (85) | (-) | (-) | (14) |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් ගත් දත්තයන් පදනම්කොට ගත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී. මුළු වී ප්‍රමාණය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී.

මූලයන් : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශය
වී අලෙවි මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සමස්ථ සාමාන්‍ය ඵලදාව වැඩිවීමට කන්න දෙකෙහිම සතුටුදායක නිෂ්පාදන ක්‍රියාකාරිත්වය දායක විය. 1994/95 මහ කන්නයේ සාමාන්‍ය ඵලදාව සියයට 8 කින් වැඩි වී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,603 ක් විය. පසුගිය වර්ෂයේ යල කන්නයේ සියයට 2 කින් පහත වැටුණු සාමාන්‍ය ඵලදාව 1995 යල කන්නයේ සියයට 1 කින් වැඩි වී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,427 ක් විය. මහවැලි " එච් " කලාපය නැවත වරක් මහ කන්නයේදී ප්‍රමුඛ ස්ථානය ලබාගනිමින් හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 5,340 ක් වශයෙන් මෙතෙක් වාර්තා නොවූ අන්දමේ ඉහලම ඵලදාවක් වාර්තා කළේය. උඩවලවේ ප්‍රදේශය දෙවන ස්ථානයට පත්වෙමින් සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,888 ක් විය. කෙසේ වෙතත්, උඩ වලවේ ප්‍රදේශය දස වන වර්ෂයටත් යල කන්නයේ ඉහළම සාමාන්‍ය ඵලදාව වූ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,669 ක් වාර්තා කළේය.

පසුගිය මහ කන්නය සමඟ සසඳා බලන කල 1994/95 මහ කන්නයේ විශාල හා සුළු වාරිමාර්ග ප්‍රදේශයන්හි සාමාන්‍ය ඵලදාව පිළිවෙලින් සියයට 15 කින් සහ සියයට 7 කින් වැඩි වී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,923 ක් හා හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,292 ක් විය. කෙසේ වෙතත්, 1994/95 මහ කන්නයේ වර්ෂාපෝෂිත ප්‍රදේශයන්හි සාමාන්‍ය ඵලදාව සියයට 1 කින් පහත වැටී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 2,814 ක් විය. 1995 යල කන්නයේ විශාල වාරිමාර්ග ප්‍රදේශවල සාමාන්‍ය ඵලදාව සියයට 2 කින් පහත වැටී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,529 ක් විය. මේ අතර 1995 යල කන්නයේ සුළු වාරිමාර්ග හා වර්ෂාපෝෂිත ප්‍රදේශවල සාමාන්‍ය ඵලදාව පිළිවෙලින් සියයට 7 කින් සහ සියයට 2 කින් වැඩිවී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,062 ක් සහ හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 2,525 ක් විය.

වගා වර්ෂය තුලදී වී වගා කරන ලද දළ බිම් ප්‍රමාණය සියයට 2 කින් පහත වැටී හෙක්ටයාර 915,000 ක් විය. වගා කරන ලද බිම් ප්‍රමාණයෙහි අඩුවීම් කන්න දෙක තුලම පෙන්නුම් කෙරිණි. මහ කන්නයේ දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය සියයට 3 කින් පහත වැටී හෙක්ටයාර 566,000 ක් වූ අතර, යල කන්නයේදී මෙය සුළු වශයෙන් පහත වැටී හෙක්ටයාර 348,000 ක් විය. 1995 වගා වර්ෂය තුලදී අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය, පසුගිය වගා වර්ෂයේ බිම් ප්‍රමාණය වූ හෙක්ටයාර 897,000 සිට සියයට 1 කින් අඩු වී හෙක්ටයාර 890,000 ක් විය. මහ කන්නයේ අස්වැන්න නෙලාගන්නා ලද දළ බිම් ප්‍රමාණය සියයට 2 කින් පහත වැටී හෙක්ටයාර 549,000 ක් වූ අතර, 1995 යල කන්නයේ එය සියයට 1 කින් වැඩි වී හෙක්ටයාර 340,000 ක් විය.

ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දත්ත වලට අනුව, 1994/95 වගා වර්ෂය තුල වී වගා අංශයේ පොහොර භාවිතය සියයට 17 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 287,000 ක් විය. මෙසේ පොහොර භාවිතය විශාල වශයෙන් වැඩිවීමට හේතුවූයේ 1994/95 මහ කන්නය ආරම්භ වීමත් සමඟම 1994 ඔක්තෝබර් මාසයේදී පොහොර සහනාධාරය නැවත හඳුන්වා දීම විය හැක. 1994/95 මහ කන්නයේදී වී වගාව සඳහා භාවිතා කල පොහොර ප්‍රමාණය සියයට 20 කින් සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 171,000 ක් වූ අතර, 1995 යල කන්නයේ පොහොර භාවිතය සියයට 12 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 116,000 ක් විය.

රජය විසින් කල් පසුවූ වගා ණය කපාහැරීම හේතුවෙන් 1994/95 මහ කන්නයේ සිට ගොවීන් වැඩි පිරිසක් ණය ලබාගැනීමට සුදුස්සන් වීම නිසා, වී වගා අංශය සඳහා දෙනු ලැබූ ණය තියුණු ලෙස ඉහල නැගුණු අතර, මෙය පොහොර භාවිතය වැඩිවීමට ද උපකාරී විය. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ 1993/94 වගා වර්ෂය තුල වී වගා අංශයට ලබා දී තිබූ ණය ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 660 හා සසඳන කල 1994/95 වගා වර්ෂයේදී රුපියල් දශලක්ෂ 806 ක් ලබා දුණි. පසුගිය මහ කන්නය තුල ලබාදී තිබූ ණය ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 453 සමඟ සසඳ බලන කල, 1994/95 මහ කන්නයේදී දෙන ලද ණය ප්‍රමාණය සියයට 26 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 570 ක් විය. 1995 යල කන්නය සඳහා දෙන ලද ණය ප්‍රමාණයද පසුගිය යල කන්නයට වඩා සියයට 14 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 236 ක් විය.

1995 වර්ෂයේදී වී අලෙවි මණ්ඩලය මගින් මිලදී ගන්නා ලද වී ප්‍රමාණය දෙගුණයටත් වඩා වර්ධනයක් පෙන්නුම් කරයි. 1994 වර්ෂයේ දී වී අලෙවි මණ්ඩලය මගින් මිලදී ගන්නා ලද වී ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 120,000 හා සසඳන කල, 1995 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 282,000 ක් වූ අතර, එය මුළු වී නිෂ්පාදනයෙන් සියයට 10 කට දායක විය. විශේෂයෙන්ම අස්වැන්න නෙලනු ලබන කාලසීමාව තුලදීද විවෘත වෙළඳපොලේ වී මිල සහතික මිලටද වඩා තියුණු ලෙස පහත වැටීම හේතුවෙන්, 1995 වර්ෂයේදී වී අලෙවි මණ්ඩලයට වී විශාල ප්‍රමාණයක් මිලදී ගැනීමට හැකිවිය. පසුගිය වර්ෂයේදී මෙන්ම 1995 වර්ෂයේදී ද වී සඳහා වන සහතික මිල බුසලකට රුපියල් 155 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. එනමුදු විවෘත වෙළෙඳපොලේ වී මිල බුසලකට රුපියල් 136 පමණ විය. 1995 වර්ෂයේ අවසාන භාගය තුලදී, තිරිඟු පිටි සහනාධාරයෙන් කොටසක් ඉවත් කිරීම, එම සහනාධාරය මගින් ඇතිකල අහිතකර බලපෑම් තරමක් දුරට හෝ නිවැරදි කිරීම පිණිස හිතකර වෙනස්වීමක් වූ අතර, මේ හේතුවෙන් වී මිල පහල වැටීම තරමක් දුරට මග හැරුණි.

අපතේ යාම් සහ බීජ අවශ්‍යතාවයන් සඳහා ගැලපීම් කිරීමෙන් පසුව, වී නිෂ්පාදනයේ සහල් සමානය මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.8 ක් විය. 1994 වර්ෂයේ මෙට්‍රික් ටොන් 58,000 ක් වූ ආනයනය කල සහල් ප්‍රමාණය 1995 වර්ෂයේදී වී නිෂ්පාදනය වැඩිවීම හේතුවෙන් මෙට්‍රික් ටොන් 9,000 දක්වා පහල වැටුණි. මෙය මෑත කාලයේදී ආනයනය කරන ලද අඩුම සහල් ප්‍රමාණය වේ. කෙසේ වෙතත්, පසුගිය වර්ෂය සමඟ සසඳා බලන කල, වර්ෂය තුලදී ආනයනය කරන ලද තිරිඟු ඇට ප්‍රමාණය සියයට 28 කින් වැඩි වී මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.1 ක් විය. ලෝක වෙළඳපලේ මිල ගණන් ඉතා ඉහළ තත්ත්වයක පැවතුනද, තිරිඟු ඇට ආනයනය විශාල වශයෙන් ඉහළ යෑමට හේතුවූයේ තිරිඟු පිටි මිලට විශාල සහනාධාරයක් ලබාදීම හේතුවෙන්, සහල් වෙනුවට තිරිඟු පිටි ඉල්ලුම වැඩි වීම විය හැකිය.

## සීනි

1995 වර්ෂයෙහි සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 71,416 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙය 1994 වර්ෂයෙහි වාර්තාගත නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් 72,275 ට වඩා සියයට 1 කින් පහත වැටීමකි. සමස්ථ සීනි නිෂ්පාදනය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ හිඟුරාණ සීනි කර්මාන්ත ආයතනයේ නිෂ්පාදනය, 1994 වර්ෂයේ මෙට්‍රික් ටොන් 14,058 සිට 1995 වර්ෂයේ මෙට්‍රික් ටොන් 9,681 දක්වා සියයට 31 කින් පහත වැටීමයි. මේ අතර, 1995 වර්ෂයේ පැල්වත්ත සහ සෙවනගල කර්මාන්තශාලා වල සීනි නිෂ්පාදනය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 39,682 සිට මෙට්‍රික් ටොන් 43,081 දක්වා සහ මෙට්‍රික් ටොන්

සංඛ්‍යා සටහන 3.7

## සීනි නිෂ්පාදන අංශය පිළිබඳ සංඛ්‍යා 1994 - 1995

| අයිතමය | ඒකකය | හිඟුරාණ සීනි කම්හල | | සෙවනගල සීනි කම්හල | | පැලවත්ත සීනි කම්හල | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1994(අ) | 1995(ආ) | 1994(අ) | 1995(ආ) | 1994(අ) | 1995(ආ) | 1994(අ) | 1995(ආ) |
| උක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය (නිරි වගාව ඇතුළුව) (ඇ) | හෙක්ටයාර | 3,019 | 2,098 | 3,460 | 3,130 | 5,032 | 5,346 | 11,511 | 10,574 |
| උක් දඬු කපා ගත් බිම් ප්‍රමාණය (ඇ) | හෙක්ටයාර | 2,505 | 1,920 | 2,331 | 2,503 | 8,543(ඈ) | 9,151(ඈ) | 13,379 | 13,574 |
| කපාගත් උක් දඬු ප්‍රමාණය (ඇ) | මෙට්‍රික් ටොන් | 140,217 | 79,542 | 210,105 | 219,903 | 246,105 | 325,998 | 596,427 | 625,443 |
| පෞද්ගලික අංශයෙන් මිලට ගත් උක් දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් | 48,605 | 65,583 | 1,748 | 1,898 | 227,210 | 248,902 | 277,563 | 316,383 |
| අඹරන ලද උක් දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් | 188,822 | 145,125 | 211,853 | 221,801 | 473,315 | 547,900 | 873,990 | 914,826 |
| සාමාන්‍ය ඵලදාව (ඇ) | හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් | 56 | 41 | 90 | 88 | 55 | 60 | 67 | 67 |
| නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය (අපතේ යන සීනි වලින් කළ නිෂ්පාදන හැර) | මෙට්‍රික් ටොන් | 14,058 | 9,681 | 18,535 | 18,654 | 39,682 | 43,081 | 72,275 | 71,416 |
| සීනි ලබාගැනීමේ ප්‍රතිශතය (ඉ) | % | 7.45 | 6.67 | 8.74 | 8.41 | 8.38 | 7.49 | 8.27 | 7.81 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) කේන්ද්‍රීය වගාවන් සහ බිම් කට්ටිකරුවන් සතු වගාවන් ද ඇතුළත් වේ.
(ඈ) කේන්ද්‍රීය වගාවන් බිම්කට්ටිකරුවන් සතු වගාවන් සහ පිටස්තර වැවිලිකරුවන්ගේ ඉඩම්ද ඇතුලත් වේ.

$$(ඉ)\ සීනි\ ලබාගැනීමේ\ ප්‍රතිශතය = \frac{නිෂ්පාදනය\ කල\ සීනි\ ප්‍රමාණය}{අඹරන\ ලද\ උක්දඩු\ ප්‍රමාණය} \times 100$$

මූලයන්: සීමාසහිත පැල්වත්ත සීනි කර්මාන්තායතනය
සීමාසහිත සෙවනගල සීනි කර්මාන්තායතනය
සීමාසහිත හිඟුරාණ සීනි කර්මාන්තායතනය

18,535 සිට මෙට්‍රික් ටොන් 18,654 දක්වා පිළිවෙලින් සියයට 9 කින් සහ සියයට 1 කින් වැඩි විය. පසුගිය වර්ෂයේදී මෙන්ම 1995 වර්ෂයේදීද කන්තලේ සීනි කර්මාන්ත ආයතනයේ නිෂ්පාදන කටයුතු සිදු නොවිණි.

විමසුමට ලක් කෙරෙන වර්ෂය තුළ දී හිඟුරාණ කම්හලෙහි සීනි නිෂ්පාදනය අඩුවීමට හේතු වූයේ උක්දඩුවලින් සීනි ලබාගැනීමේ අනුපාතය මෙන්ම, උපරිම වශයෙන් අස්වැන්න නෙලාගන්නා කාලයේදී කම්කරු ආරවුල් පැවතීම හේතුවෙන් මිරිකන ලද උක්දඩු ප්‍රමාණයද පහත වැටීමය. හිඟුරාණ කම්හලෙහි මිරිකන ලද උක්දඩු ප්‍රමාණය පෙර වර්ෂයේ මිරිකන ලද උක්දඩු ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 188,822 හි සිට මෙට්‍රික් ටොන් 145,125 දක්වා සියයට 23 කින් අඩුවිය. මීට පටහැනිව, සෙවනගල කම්හලෙහි මිරිකනලද උක්දඩු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 221,801 දක්වා සියයට 5 කින් ඉහළ ගිය අතර, පැල්වත්ත කම්හලෙහි මිරිකන ලද උක්දඩු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 547,900 දක්වා සියයට 16 කින් ඉහළ ගියේය. වසර තුළ කම්හල් තුනෙහිම මිරිකන ලද උක්දඩු ප්‍රමාණය 1994 දී මෙට්‍රික් ටොන් 873,990 හි සිට මෙට්‍රික් ටොන් 914,826 දක්වා සියයට 5 කින් වැඩිවිය.

මෙම කර්මාන්තශාලා තුන සඳහා වන සමස්ථ සීනි ලබාගැනීමේ අනුපාතය,1995 වර්ෂයේදී නොකඩවා තෙවැනි වර්ෂයටද අඩුවිය. මෙය 1994 දී වූ සියයට 8.27 හි සිට 1995 දී සියයට 7.81 දක්වා පහත වැටුණි. නොකඩවා හයවන වර්ෂයටද සෙවනගල කර්මාන්ත ශාලාව ඉහළම සීනි ලබාගැනීමේ අනුපාතය වාර්තා කරන ලදි.

1995 වර්ෂයේදී හිඟුරාණ සහ සෙවනගල කර්මාන්ත යටතේ ඇති කේන්ද්‍රීය වගාවන්හි සාමාන්‍ය උක්දඩු ඵලදාව පිළිවෙලින් හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 41 හා මෙට්‍රික් ටොන් 88 දක්වා සියයට 27 කින් හා සියයට 2 කින් අඩුවිය. 1994 දී සියයට 23 කින් ඉහළ ගිය පැල්වත්ත කම්හල යටතේ ඇති වගාවන්හි සාමාන්‍ය ඵලදාව, 1995 දී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 60 දක්වා සියයට 9 කින් තවදුරටත් වැඩි විය. නොකඩවා පස්වැනි වර්ෂයටද සෙවනගල කර්මාන්තශාලාව ඉහළම සාමාන්‍ය ඵලදාව වාර්තා කළේය. මෙම කර්මාන්තායතන තුන යටතේම ඇති කේන්ද්‍රීය වගාබිම්වල සමස්ත සාමාන්‍ය ඵලදාව 1994 වර්ෂයෙහි පැවැති මට්ටමෙහිම විය.

පෞද්ගලික වැවිලිකරුවන් විසින් සීනි කර්මාන්තශාලා වලට සපයන ලද උක්දඩු ප්‍රමාණය, 1995 දී මෙට්‍රික්ටොන් 316,383 ක් දක්වා සියයට 14 කින් වැඩිවිය. හිඟුරාණ කර්මාන්ත ශාලාව විසින් මිලදී ගත් උක්දඩු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 65,583 දක්වා සියයට 35 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. මේ අතර සෙවනගල හා පැල්වත්ත කර්මාන්ත ශාලා විසින් මිලදී ගන්නා ලද උක්දඩු ප්‍රමාණය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 1,898 හා 248,902 දක්වා සියයට 9 කින් හා සියයට 10 කින් වැඩි විය. 1994 දී මිරිකන ලද මුළු උක්දඩු ප්‍රමාණයෙන් සියයට 32 ක් ලෙස වාර්තා වූ පෞද්ගලික අංශයෙන් මිළදී ගත් උක්දඩු ප්‍රමාණය, මෙම වර්ෂයේදී සියයට 35 ක් විය.

වර්තමානයේ දේශීය සීනි නිෂ්පාදනය මෙරට මුළු සීනි පරිභෝජන අවශ්‍යතාවයෙන් සියයට 15 ක ප්‍රමාණයක් සපුරාලීමට ප්‍රමාණවත් වේ. 1994 වර්ෂය තුලදී ආනයනය කරන ලද සීනි ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 491,000 සමඟ සසඳ බලන කල 1995 වර්ෂයේදී ආනයනය කරන ලද සීනි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 416,909 ක් විය.

## අනෙකුත් ක්ෂේත්‍ර බෝග

මිරිස්, ළූණු සහ අර්තාපල් වැනි ඉහල මූල්‍යමය වටිනාකමක් ඇති වාණිජ බෝග සහ බඩ ඉරිඟු සහ කුරක්කන් වැනි අඩු මූල්‍යමය වටිනාකම් ඇති ධාන්‍ය බෝග යන විවිධාකාර වූ බෝග සමූහයකින් අනෙකුත් ක්ෂේත්‍ර බෝග සමන්විත වේ. ඉහතින් සඳහන් කරන ලද ඉහළ වටිනාකම් ඇති බෝග හැරුණු

කොට අනෙකුත් සියළුම ක්ෂේත්‍ර බෝග වගා කරනු ලබන්නේ කුඩා ඉඩම් කට්ටිවල හෝ ගෙවතුවල අක්‍රමවත් පිළිවෙලටය. මේ නිසා මෙවැනි බෝගවලට අදාලව පවතින බොහොමයක් දත්ත දළ ඇස්තමේන්තු වේ.

කෘෂිකර්ම, ඉඩම් සහ වන සම්පත් අමාත්‍යාංශයේ තාවකාලික දත්තවලට අනුව, 1995 වර්ෂයේදී අර්තාපල්, සෝයා බෝංචි සහ තල වැනි බෝග නිෂ්පාදනය විශාල වශයෙන් වර්ධනය විය. අර්තාපල් අස්වැන්න මෑත කාලයේ වාර්තා වූ වැඩිම නිෂ්පාදනය පෙන්නුම් කරමින්, සියයට 44 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 101,600 ක් විය. මෙම නිෂ්පාදනය වැඩිවීමට ඵලදාව වැඩිවීම මෙන්ම වගා කළ බිම් ප්‍රමාණය වැඩිවීමද හේතු විය. 1994 වර්ෂයේදී ලබා ගන්නා ලද හෙක්ටයාරයකට අර්තාපල් ඵලදාව මෙට්‍රික් ටොන් 8,300 සමඟ සසඳ බලන කල, මෙම වර්ෂයේදී ලබා ගන්නා ලද ඵලදාව හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 11,250 ක් දක්වා සියයට 36 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්විය. හොඳ තත්ත්වයේ ආනයනික බීජ අර්තාපල් විශාල තොග පැවතිම, යහපත් කාලගුණික තත්ත්වයක් පැවතිම සහ සම්ප්‍රදායික අර්තාපල් වගා කරන බිම් ප්‍රදේශවලින් බැහැරවද වගාව පැතිර යෑම යන හේතුන් අර්තාපල් ඵලදාවෙහි හා වගා කරන ලද බිම් ප්‍රමාණයෙහි සැලකිය යුතු වර්ධනයට හේතු විය. 1994 වර්ෂයේ මෙට්‍රික් ටොන් 3,500 ක් වූ තල නිෂ්පාදනය හා සසඳන කල මෙම වර්ෂයේදී එය සියයට 74 කින් වැඩිවීමක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 6,100 ක් විය. එසේ වුවද, 1995 වර්ෂයේ තල නිෂ්පාදනය, 1991 වර්ෂයේ වාර්තාගත වූ නිෂ්පාදනයට වඩා අඩකටත් වඩා අඩු විය. මෙම අඩුවීමට උතුරු සහ නැගෙනහිර පලාත්වල සහ ඒ ආශ්‍රිත මායිම් ගම්මානවල අස්ථාවර තත්ත්වයක් පැවති ප්‍රදේශවල නිෂ්පාදනයන් පහත වැටීම හේතු විය.

පසුගිය වර්ෂය සමඟ සසඳන කල 1995 වර්ෂයේ අනෙකුත් ක්ෂේත්‍ර බෝගයන් බොහොමයක නිෂ්පාදනයේ අඩුවීමක් දක්නට ලැබුණි (සංඛ්‍යා සටහන 16). 1994 වර්ෂයේ ලොකු ළූණු නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් 81,400 දැනට වාර්තාගතවී ඇති ඉහළම නිෂ්පාදනය වුවද, 1995 වර්ෂයේදී එය සියයට 45 ක තියුණු අඩුවීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 44,500 ක් විය. 1994 වර්ෂයේ ලබාගත් වැඩිම ලොකු ළූණු නිෂ්පාදනයෙන් පසු විශේෂයෙන් අලෙවිය පිළිබඳ ගැටළුවකට මුහුණ දුන් හෙයින් විමසුමට ලක්කරන වර්ෂයේ මෙම බෝගය වගා කිරිමට එතරම් උනන්දුවක් නොදැක්විය. 1994 වර්ෂයේ හෙක්ටයාර 7,800 ක් වූ ලොකු ළූණු වගා කළ බිම් ප්‍රමාණය, 1995 වර්ෂයේදී හෙක්ටයාර 4,400 දක්වා අඩුවිය. 1994 වර්ෂය හා සසඳන කළ රතුළූණු, මිරිස් සහ මුං ඇට නිෂ්පාදනය පිළිවෙලින් සියයට 18 කින්, සියයට 10 කින් සහ සියයට 8 කින් අඩුවිය. වර්ෂය තුලදී වී වගාවට උචිත දේශගුණික තත්ත්වයක් පැවතීම නිසා විශේෂයෙන් 1994/95 මහ කන්නය තුලදී මෙම බෝගයන් වගාකල බිම් ප්‍රමාණයෙහි අඩුවීම හේතුවෙන් 1995 වර්ෂය තුලදී ඉහත සඳහන් බෝගයන්ගේ නිෂ්පාදනය අඩුවිය.

1995 වර්ෂය තුළදීද වී අලෙවි මණ්ඩලය මගින් අනෙකුත් ක්ෂේත්‍ර බෝග සඳහා වූ පදනම් මිල යෝජනා ක්‍රමය නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. මෙම පදනම් මිල ගණන් 1993 සිට වෙනස් වී නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පදනම් මිල අඩු ආකර්ෂණීයත්වයක් ඉසිලූ අතර, පෞද්ගලික වෙළඳුන් වී අලෙවි මණ්ඩලය සමඟ තරඟ කරමින් වෙළෙඳපොලේ ක්‍රියාකාරි සහභාගිවන්නන් බවට පත්විය.

## 3.5 ධීවර සහ පශු නිෂ්පාදනය

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ ඇස්තමේන්තුවලට අනුව 1995 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 237,550 ක් විය. මෙය පසුගිය වර්ෂය සමඟ සසඳන කල සියයට 6 ක වැඩිවීමකි. මෙසේ නිෂ්පාදනය වැඩිවීමට මුහුදු ධීවර සහ ජල ජීවී යන අංශ දෙකම දායකවිය. මේ අතර, 1995 වර්ෂයේ කරවල නිෂ්පාදනය සියයට 24 කින් පහත වැටුණි. වර්ෂය තුළදී මුහුදු ධීවර නිෂ්පාදනය වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ධීවර කර්මාන්තය සඳහා අළුත් බෝට්ටු, යන්ත්‍ර සහ මාළු ඇල්ලීම සඳහා වන උපකරණ අළුතින් එක් වීම, මෙන්ම උතුරු නැගෙනහිර පළාත්වල 1995 අප්‍රේල් මස අග භාගය වනතුරු එදිරිවාදිකම් අත්හිටුවා තිබීමත්ය. එක් දින බෝට්ටු, බහු දින යාත්‍රා බවට පත්කිරීම් වැඩිවීමද, තවදුරටත් නිෂ්පාදනයේ වර්ධනයට හේතු විය. ජල ජීවී මත්ස්‍ය නිෂ්පාදනය වැඩිවීමට හේතුවූයේ හොඳ කළමණාකරණය සහ මිරිදිය මත්ස්‍ය අංශයේ ශක්තිමත් ව්‍යාප්ති සේවාවක් පවත්වාගෙන යාමයි.

මුළු මත්ස්‍ය නිෂ්පාදනයට සියයට 92 කින් දායක වූ, මුහුදු ධීවර අනු අංශය 1994 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 212,000 සිට සියයට 3 ක වැඩිවීමක් පෙන්වමින් 1995 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 217,550 ක් විය. පසුගිය කාලයේදී මෙන්ම, මත්ස්‍ය නිෂ්පාදන අංශයේ ප්‍රධානියා වූ පෞද්ගලික අංශයේ නිෂ්පාදනය මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 99ක් ලෙස ගණන් බලා ඇත. 1995 වර්ෂයේ ලංකා ධීවර සංස්ථාවේ මුළු මත්ස්‍ය සැපයුම සියයට 8 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 2,400 ක් විය. පසුගිය වර්ෂයේ සියයට 18 ක අඩුවීමක් පෙන්නුම් කළ ලංකා ධීවර සංස්ථාවේ අයිස් නිෂ්පාදනය, 1995 වර්ෂයේ සියයට 38 ක වැඩිවීමක් පෙන්වමින් දළ වශයෙන් මෙට්‍රික් ටොන් 5,090 ක් පමණ විය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අනුරාධපුරයේ සහ පේසාලෙහි අයිස් කර්මාන්තශාලා නැවත ආරම්භ කිරීමයි.

මුහුදු ධීවර අංශයට මුදා හරින ලද සහනාධාර ප්‍රමාණය 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 75 සමග සසඳ බලන කල 1995 වර්ෂයේ එය දළ වශයෙන් රුපියල් දශලක්ෂ 60 ක් විය. නිෂ්පාදන සහනාධාර ක්‍රමය යටතේ, යාන්ත්‍රික එක්දින බෝට්ටු 196 ක්, බහු දින බෝට්ටු 40 ක්, සම්ප්‍රදායික යාත්‍රා 333 ක්, ධීවර ආම්පන්න ඒකක 406 ක්, එස්.එස්.බී. ගුවන් විදුලි යන්ත්‍ර 19 ක් සහ චන්ද්‍රිකා ධාවනමාන 42 ක් මුහුදු ධීවර අංශය සඳහා නිකුත් කරන ලදී. පසුගිය වර්ෂයේදී බහු දින බෝට්ටු 40 ක්, සම්ප්‍රදායික යාත්‍රා 145 ක් සහ යාන්ත්‍රික එක් දින බෝට්ටු 69 ක් පමණක් නිකුත් කරන ලදී.පසුගිය වර්ෂයේදී මෙන්ම, මුළු ධීවර සමුපකාර සමිති සංඛ්‍යාව සහ ඒවායේ මුළු සාමාජික සංඛ්‍යාව පිළිවෙලින් 769 ක් හා 86,966 ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

නිෂ්පාදනය වැඩිවීමක් පැවතියද, පසුගිය වර්ෂය සමඟ සසඳ බැලීමේදී සියළුම මාළු වර්ගවල සාමාන්‍ය සිල්ලර මිල සියයට 22 කින් පමණ වැඩිවිය. පසුගිය වර්ෂයේ මෙට්‍රික් ටොන් 7,194 ක් ලෙස වාර්තා වූ මුළු මත්ස්‍ය අපනයන ප්‍රමාණය 1995 වර්ෂයේදී සියයට 4 කින් වැඩි වී මෙට්‍රික්

සංඛ්‍යා සටහන 3.8

### මත්ස්‍ය නිෂ්පාදනය 1991 - 1995

මෙට්‍රික් ටොන්

| අනු අංශ | 1991 | 1992 | 1993 | 1994(අ) | 1995(ආ) |
|---|---|---|---|---|---|
| මුහුදු මත්ස්‍ය (ඇ) | 174,231 | 185,168 | 202,900 | 212,000 | 217,550 |
| ජල ජීවී (ඈ) | 23,832 | 21,000 | 18,000 | 12,000 | 20,000 |
| එකතුව | 198,063 | 206,168 | 220,900 | 224,000 | 237,550 |

මූලය : ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදුබඩ හා ගැඹුරු මුහුදු ධීවර අංශයන්
(ඈ) 1994 වන තෙක් මිරිදිය මත්ස්‍ය අංශය පමණක් ඇතුලත් වේ. 1995 සිට මිරිදිය අංශය, වෙරළබඩ කලපු ජලයෙහි ඉස්සන් සහ වගාකරන ලද ඉස්සන් නිෂ්පාදනය ද ඇතුලත් වේ.

ටොන් 7,457 ක් විය. කෙසේ වුවද. වර්ෂය තුළදී විත් මාළු සහ කරවල වශයෙන් ආනයනය කරන ලද මුළු මත්ස්‍ය ප්‍රමාණයද සියයට 21 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 68,348 විය.

1995 වර්ෂයේදී ද බිත්තර නිෂ්පාදනයේ ප්‍රමුඛස්ථානය පෞද්ගලික අංශයට හිමි විය. 1994 වර්ෂයේ දශලක්ෂ 863 ක් වූ බිත්තර නිෂ්පාදනය සුළු අඩුවීමක් පෙන්නුම් කරමින් 1995 වර්ෂයේ දශලක්ෂ 862 ක් විය. සත්ව ආහාර නිෂ්පාදකයන්ගේ කර්මාන්තය බොහෝදුරට ඒකාධිකාරී ස්වරූපයක් උසුලන බැවින් සත්ව ආහාර මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම නිසා කුඩා පරිමාණයේ ගොවීන් විශාල පිරිසක් ව්‍යාපාරයෙන් ඉවත් වී යාම සහ පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළවල බිත්තර නිෂ්පාදනයේ පහළ වැටීම නිෂ්පාදනය අඩුවීමට හේතු විය.

1995 වර්ෂයේ මුළු කිරි නිෂ්පාදනය ලීටර් දශලක්ෂ 253 ක් දක්වා සුළු වශයෙන් වැඩි වූ අතර, මී දෙනුන්ගේ කිරි නිෂ්පාදනය සියයට 2 කින් අඩු වී ලීටර් දශලක්ෂ 80 ක් විය. 1994 වර්ෂයේ වාර්තා වූ ලීටර් දශලක්ෂ 44 ට වඩා සියයට 14 ක වැඩි වීමක් පෙන්වමින් 1995 වර්ෂයේ සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගම (මිල්කෝ) මගින් එකතු කළ කිරි ප්‍රමාණය ලීටර් දශලක්ෂ 50 ක් දක්වා ඉහළ නැගුණි. මෙම සමස්ථ වැඩිවීමට හේතු වී ඇත්තේ අනුරාධපුරය හා මඩකලපුව දිස්ත්‍රික්ක වලින් විශාල වශයෙන් කිරි මිලදී ගැනීමයි. සීමාසහිත නෙස්ලේ ලංකා සමාගම සහ අනෙකුත් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන වලින් එකතු කරන ලද කිරි ප්‍රමාණයද 1994 වර්ෂයේ ලීටර් දශලක්ෂ 35 සිට 1995 වර්ෂයේ ලීටර් දශලක්ෂ 38 ක් දක්වා සියයට 9 කින් වැඩිවිය. මුළු කිරි නිෂ්පාදනයට සපුරාලිය හැකිව ඇත්තේ රටෙහි මුළු කිරි සහ කිරි නිෂ්පාදන අවශ්‍යතාවයෙන් සියයට 30 ක් පමණ වේ. මෙය ඵලදායි ආනයන ආදේශකයක් ඇති කිරීමට සුදුසු අංශයකි. 1995 වර්ෂය තුළදී කිරි ලීටරයක් සඳහා නිෂ්පාදකයාට ගෙවූ මිලෙහි ඉහළ යාමක් සිදු නොවූ බැවින් කිරි නිෂ්පාදකයාට ලැබීමට තිබූ ලාභ ආන්තිකය පහත වැටිණි. සම්පූර්ණ යොදය සහිත (මේදය සියයට 26) කිරිපිටි ආනයනයට යෙදූ තීරුබදු සියයට 10 කින් අඩු කිරීම පාරිභෝගිකයාට වාසිදායක වූවද දේශීය පශු නිෂ්පාදන කර්මාන්තය අධෛර්යමත් කිරීමට හේතු විය.

## 3.6 යෙදවුම් සහ ණය

### පොහොර

1995 ලිත් වර්ෂය තුළදී භාවිතා කරන ලද මුළු පොහොර ප්‍රමාණය සියයට 5කින් අඩු වී මෙට්‍රික් ටොන් 506,400 ක් විය. පොල් වගා අංශය හැරුණුවිට අනෙකුත් සියළුම අංශයන් සඳහා භාවිතා කරන ලද පොහොර ප්‍රමාණයන්හි අඩුවීම, මෙම අඩුවීමට හේතුවිය. වී වගා අංශය සඳහා භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය. වර්ෂය තුළදී වගා කරන ලද බිම් ප්‍රමාණයෙහි අඩුවීම හේතුවෙන්, සියයට 4 කින් පහත වැටුණු අතර එය මුළු පොහොර භාවිතයෙන් සියයට 51 ක් ලෙස ගණන් බලා ඇත. 1995 වර්ෂයේදී තේ වගා අංශය සඳහා භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 4කින් අඩුවී මෙට්‍රික් ටොන් 120,300 ක් විය. රබර් වගා අංශය සඳහා භාවිතා කළ පොහොර ප්‍රමාණය 1995 වර්ෂයේදී සියයට 13කින් අඩුවී මෙට්‍රික් ටොන් 14,900 ක් විය. දුම්කොළ, එළවළු, පළතුරු සහ මල්පැල වැනි වගා අංශයන් සඳහා භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 10 කින් අඩුවී මෙට්‍රික් ටොන් 34,900 ක් විය. පොල් වගා අංශය සඳහා භාවිතා කල පොහොර ප්‍රමාණය සියයට 8 කින් වැඩිවිය. පොහොර සහනාධාරය 1994 ඔක්තෝබර් 10 දින සිට නැවත හඳුන්වා දෙනු ලැබුවද, භාවිතා කරන ලද මුළු පොහොර ප්‍රමාණය සියයට 15කින් පමණ පහත වැටුණි. මෙම පහත වැටීමට විශේෂයෙන්ම හේතු වූයේ,1995 අවසාන කාර්තුවේදී භාවිතා කළ පොහොර ප්‍රමාණය අඩුවීමය. මෙම කාලපරිච්ඡේදය තුළදී, ඊසානදිග මෝසමේ වැසි නොලැබීම හේතුවෙන් ඇති වූ නියඟ තත්ත්වය යටතේ පොහොර යෙදවීමට යෝග්‍ය නොවීම නිසා පොහොර භාවිතය අඩුවිය. එසේම මෙම අඩුවීමට ජාත්‍යන්තර පොහොර මිල ගණන්වල වැඩිවීම ද හේතුවිය.

ප්‍රධාන පොහොර වර්ග හතර වන යූරියා, ඇමෝනියම් සල්පේට්, මියුරියේට් ඔෆ් පොටෑෂ් සහ ට්‍රිපල් සුපර් පොස්පේට් සඳහා වූ සියයට 30 ක පොහොර සහනාධාරය 1995 ජනවාරි 31 වන දින සිට නවතා දමන ලදී. එසේ වුවද. යූරියා සහ ට්‍රිපල් සුපර් පොස්පේට් සඳහා වූ ආනයනික මිල සැළකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් 1995 පෙබරවාරි 01 දින සිට 1995 අප්‍රේල් 3 දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී අන්තර් කාලීන පියවරක් වශයෙන් මෙම වර්ග දෙක සඳහා සහනාධාර ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය යටතේ ආනයනකරුවාට යූරියා

**සංඛ්‍යා සටහන 3.9**

**බෝග අනුව පොහොර භාවිතය 1992 - 1995**

මෙට්‍රික් ටොන් දහස්

| බෝගය | 1992 | 1993 | 1994(අ) | 1995(ආ) |
|---|---|---|---|---|
| වී | 207.8 | 248.0 | 269.7 | 258.0 |
| තේ | 110.2 | 147.2 | 126.4 | 120.3 |
| රබර් | 13.1 | 17.9 | 17.2 | 14.9 |
| පොල් | 34.3 | 35.1 | 31.2 | 33.6 |
| අනෙකුත් ක්ෂේත්‍ර බෝග | 49.5 | 44.3 | 40.6 | 39.5 |
| අනෙකුත් අපනයන බෝග | 7.1 | 7.0 | 5.6 | 5.2 |
| අනෙකුත් | 53.8 | 48.6 | 41.9 | 34.9 |
| එකතුව | 475.8 | 548.1 | 532.6 | 506.4 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.


මූලය : ජාතික පොහොර ලේකම් කාර්යාලය

මෙට්‍රික් ටොන් එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 80 සහ ට්‍රිපල් සුපර් පොස්පේට් මෙට්‍රික් ටොන් එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 20ක් සහනාධාර වශයෙන් ගෙවන ලදී. 1995 අප්‍රේල් 04 වන දින සිට ක්‍රියාත්මක කරන ලද නව පොහොර සහනාධාර ක්‍රමය යටතේ ආනයනකරුවාට යූරියා මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 131 ක්, ඇමෝනියම් සල්පේට් සඳහා මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 29 ක්, මියුරියේට් ඔප් පොටෑෂ් සඳහා මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 19 ක් සහ ට්‍රිපල් සුපර් පොස්පේට් සඳහා මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 59 ක් ලෙස ගෙවිය හැකි උපරිම සහනාධාර අනුපාතයන් තීරණය විය. කිලෝග්‍රෑම් 50 ක බෑගයකට වෙළඳපොළ මිල, යූරියා සඳහා රුපියල් 500 ක්,

**රූප සටහන 3.5**

**ප්‍රධාන බෝග වර්ගවල පොහොර යෙදවුම්**

**(1990 = 100)**



ඇමෝනියම් සල්ෆේට් සඳහා රුපියල් 420 ක්, මියුරියේට් ඔෆ් පොටෑෂ් සඳහා රුපියල් 500 ක් සහ ට්‍රිපල් සුපර් පොස්පේට් සඳහා රුපියල් 540 ක් විය. 1995 මැයි මාසයේ සිට යූරියාවල ආනයනික මිලෙහි අඩුවීමක් සිදු වූ බැවින් උපරිම සහනාධාර මිල මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 101ක් ලෙස ගලපන ලදී. මිල ගණන් නැවතත් ඉහළ ගිය බැවින් මෙට්‍රික් ටොන් එකක් සඳහා වූ මිල ඇමෙරිකානු ඩොලර් 131 ක් ලෙස නැවතත් ගලපන ලදී. ජාතික පොහොර ලේකම් කාර්යාලයට අනුව මෙම සහනාධාර ක්‍රමය සඳහා වූ වියදම වර්ෂයකට රුපියල් දශලක්ෂ 1,700 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

රටෙහි අකාබනික පොහොර අවශ්‍යතාවයෙන් දළ වශයෙන් සියයට 95 ක් පමණ ආනයනය කරනු ලබයි. දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන අකාබනික පොහොර වන්නේ උතුරු මැද පළාතේ එප්පාවල පිහිටි ලංකා පොස්පේට් සමාගම මගින් නිපදවන රොක් පොස්පේට් සහ මධ්‍යම කඳුකරයේ සංවිධාන කිහිපයක් මගින් නිෂ්පාදනය කරනු ලබන ඩොලමයිට් (පොහොර වශයෙන් හැර අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා යොදා ගතහැකි) පමණි. 1995 වර්ෂයේ රොක් පොස්පේට් නිෂ්පාදනය සියයට 20 කින් වැඩිවී මෙට්‍රික් ටොන් 32,115ක් වූ අතර, මෙය ප්‍රධාන වශයෙන් බහුවාර්ෂික බෝග සඳහා භාවිතා කරන ආනයනික රොක් පොස්පේට් සඳහා ආදේශකයක් විය.

පොහොර අංශයේ කාර්යක්ෂමතාවය සහ තරඟකාරිත්වය දියුණු කිරීමේ අරමුණින් රජය, පෞද්ගලික අංශයේ සහභාගිත්වය උනන්දු කරවනු ලබයි. මේ අනුව දළ වශයෙන් පෞද්ගලික අංශයේ තොග වෙළඳුන් 10 දෙනෙකු පොහොර අලෙවියෙන් සියයට 40 ක් පමණ සිදු කරන බව ගණන් බලා ඇත.

## බීජ

උසස් තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍ය භාවිතය, ඵලදාව සහ ගොවියාගේ ආදායම වැඩි කරයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි බීජ සහ රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය විසින් සපයනු ලබන්නේ මෙරට මුළු බීජ අවශ්‍යතාවයන්ගෙන් සියයට 5 - 10 අතර ප්‍රමාණයක් පමණි. එබැවින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සහතික කරන ලද උසස් තත්ත්වයේ බීජ නිෂ්පාදනය කිරීම සඳහා ගොවීන් සහ පෞද්ගලික අංශය උනන්දු කරවයි. එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සංවර්ධන ආයතනය විසින් අරමුදල් සපයනු ලබන කෘෂි විවිධාංගීකරණ පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ, මහා පරිමාණ හා කුඩා පරිමාණ ව්‍යාපාරිකයින්ගෙන් සමන්විත පෞද්ගලික අංශයට මෙන්ම ගොවි සංවිධාන හා සමූපකාර සංවිධානයන්ට ද දේශීය බීජ කර්මාන්තයෙහි සංවර්ධනයට හවුල්වීමට ඉඩ සැලසී ඇත. මෙරට බීජ කර්මාන්තය දේශීය අවශ්‍යතාවයන් සපුරාලීමට සමත් නොවන බැවින්, විවෘත ආර්ථිකයෙහි ආරම්භයත් සමග පෞද්ගලික අංශය, නිරෝධායන ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රධාන බීජ ආනයනය කරන්නා මෙන්ම බෙදාහරින්නාද බවට පත්වී ඇත. මෙය පෞද්ගලික අංශයේ කාර්යක්ෂම සහභාගීත්වය ඇතිව, දේශීය බීජ කර්මාන්තය නගාලීම සඳහා ජාතික බීජ ප්‍රතිපත්තියක අවශ්‍යතාවය අවධාරණය කරයි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි බීජ සහ රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයට 1995 වර්ෂය තුළ බිත්තර වී මෙට්‍රික් ටොන් 4100 ක් (බුසල් 198,000) සහ බඩ ඉරිඟු (කිලෝග්‍රෑම් 62,000) සෝයාබෝංචි (කිලෝග්‍රෑම් 13,000) හා මුං ඇට (කිලෝග්‍රෑම් 12,000) වැනි අනෙකුත් ක්ෂේත්‍ර බෝග සඳහා අවශ්‍ය බීජ වර්ගයන් ද නිකුත් කිරීමට හැකිවිය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ කටයුතු මගින් 1995 වර්ෂය තුළදී දේශීය බාස්මති ප්‍රභේදයක් නිකුත් කිරීමට සමත්වූ අතර මාස 3 1/2 - 5 කාලයක් තුළ අස්වැන්න ලබා ගත හැකි නව වී ප්‍රභේද කිහිපයක්ද හඳුනාගෙන ඇත. අනෙකුත් ක්ෂේත්‍ර බෝග බොහොමයක් (උදාහරණ වශයෙන් මිරිස්, මුං ඇට සහ කෙටි කාලීන කව්පි වර්ග) සඳහා නව ප්‍රභේද ගණනාවක්ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හඳුනා ගැනීමට හැකිවී ඇත. මෙම ප්‍රභේද හොඳ ඵලදාව, දිගු කාලයක් ගබඩා කර තැබීමේ හැකියාව, වයිරස් වලට සහ නියඟයන්ට ඔරොත්තුදීමේ හැකියාව යන ලක්ෂණවලින් යුක්ත වේ. තවද ඉහළ ඵලදාවෙන්, සමහර වයිරස් දරා ගැනීමේ හැකියාවෙන් හා දිගු කාලයක් තබා ගැනීමේ හැකියාවෙන් යුතු එළවළු හා පළතුරු ප්‍රභේද කීපයක් ද කෘෂිකර්ම දේපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඇත.

## කෘෂි රසායනික ද්‍රව්‍ය

කෘමිනාශක, වල්නාශක සහ දිලීර නාශක වලින් සමන්විත කෘෂිරසායනික ද්‍රව්‍ය ආනයනය කරනු ලැබේ. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශය මෙම ද්‍රව්‍යන්හි ආනයනකරුවෝ වෙති. තොග සහ සිල්ලර බෙදාහැරීම් ප්‍රධාන වශයෙන් කරනු ලබන්නේ පෞද්ගලික අංශය මගිනි. සියළුම කෘෂි රසායනික ද්‍රව්‍ය ආනයනකරුවන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය.

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්ගේ වාර්තා අනුව, 1995 වර්ෂයේදී කෘෂි රසායනික ද්‍රව්‍ය විකුණුම්, මෙට්‍රික් ටොන් 6,740 දක්වා සියයට 13 කින් වැඩිවී ඇත. මුළු කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවියෙන් සියයට 45 ක් වන වල්නාශක, මෙට්‍රික් ටොන් 3,043 දක්වා සියයට 10 කින් ඉහළ ගොස් ඇත. වැඩිවන කම්කරු වැටුප් සහ කම්කරු හිඟය හේතුකොටගෙන වල් නෙලීම සඳහා ශ්‍රමය භාවිතා කිරීම වෙනුවට වල්නාශක භාවිතයට පසුගිය වර්ෂ කිහිපය තුළදී ගොවියන් ක්‍රමයෙන් යොමු විය. 1995 වර්ෂය තුළ මුළු කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවියෙන් සියයට 42 ක් පමණ වන කෘමිනාශක අලෙවිය මෙට්‍රික් ටොන් 2,843 දක්වා සියයට 21 කින් වැඩි වූ අතර, මුළු කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවියෙන් සියයට 13 ක් වන දිලීරනාශක අලෙවිය සුළු වශයෙන් වැඩිවිය.

කෘෂි රසායනික ද්‍රව්‍ය සඳහා ඉල්ලුම වැඩිවී ඇති බැවින් නිෂ්පාදන වියදම් අඩුකරීම, පරිසර සංරක්ෂණය සහ සෞඛ්‍ය ආරක්ෂාව යන කරුණු සැළකිල්ලට ගනිමින් ඒකාබද්ධ පළිබෝධනාශක ක්‍රම කෙරෙහි දැඩි අවධානය යොමු කොට ඇත.

## ණය

1994/95 වගා වර්ෂය තුළ නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,180 ක් වූ අතර ඉකුත් වගා වර්ෂය තුළ ලබා දී ඇති ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 977 ක් විය.

නොගෙවා ඉතිරිව ඇති මුල් ණය මුදලින් සියයට 25 ක ප්‍රමාණයක් ආපසු ගෙවීමේ පදනම මත, කල් ඉක්මවූ වගා ණය කපා හැරීමට හැකිවන පරිදි, 1994 සැප්තැම්බර් මාසයේදී රජය ගත් තීරණය හේතුකොටගෙන ගොවීන් වැඩි දෙනෙකුට නව වගා ණය ලබා ගැනීමට අවස්ථාව සැලසිණ. මේ අනුව 1994/95 වගා වර්ෂය තුළදී ලබාගත් ණය ප්‍රමාණයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණ. ණය ආපසු ගෙවීමේ ක්‍රියාවලිය කෙරෙහි අහිතකර ප්‍රතික්‍රියා පැන නැගිය හැකි බැවින් මේ ආකාරයේ පොදු සහන සැලසීම හිතකර නොවන බව පෙනේ.

වර්ෂය තුළදී, දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 67 ක් හෙවත් රුපියල් දශලක්ෂ 791 ක් ලබා දී ඇත්තේ 1994/95 මහ කන්නය තුළදී වන අතර ඉතිරිය වන රුපියල් දශලක්ෂ 389 ලබාදී ඇත්තේ යල කන්නය තුළදී වේ. 1994/95 මහ කන්නය තුළදී ලබා දෙන ලද ණය ප්‍රමාණය, පසුගිය මහ

කන්නය සමග සසඳ බලන කල සියයට 25 කින් වැඩිවූ අතර 1995 යල කන්නය තුළදී දෙන ලද ණය ප්‍රමාණය, පසුගිය යල කන්නයට වඩා සියයට 13 කින් වැඩි විය. වගා වර්ෂය තුළදී ලබාදුන් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 68 ක් හෙවත් රුපියල් දශලක්ෂ 806 ක් ලබා දී ඇත්තේ වී වගා අංශය සඳහා වන අතර ඉතිරිය වන රුපියල් දශලක්ෂ 374 ලබා දී ඇත්තේ අනෙකුත් ක්ෂේත්‍ර භෝග වගාවන් සඳහා වේ. රාජ්‍ය බැංකු දෙක එකට ගත් කල ලබාදී ඇති ණය ප්‍රමාණය, දී ඇති මුළු වගා ණය ප්‍රමාණයෙන් සියයට 80 ක් හෙවත් රුපියල් දශලක්ෂ 943 ක් ලෙස ගණන් බලා ඇත.

විධිමත් මූල්‍ය අංශය මගින් ග්‍රාමීය කෘෂිකාර්මික අංශය සඳහා දෙන ලද වගා ණය ප්‍රමාණය ඉහළ නැගුන ද තවමත් කෘෂිකාර්මික අංශයේ ණය අවශ්‍යතාවලින් බොහොමයක් අවිධිමත් මූල්‍ය මූලාශ්‍රයන් මත රඳා පවතී.

## 3.7 වන සම්පත්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව, දිවයිනේ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 31 ක් පමණ එනම් හෙක්ටයාර දශලක්ෂ 2 ක් පමණ දැනට වනාන්තර වලින් වැසී පවතී. නිරන්තර ජනගහන වර්ධනය හා ආර්ථික කටයුතු වර්ධනය වීම මගින් වන සම්පත් සඳහා වන ඉල්ලුම ඉහළයාම නිසා සාමාන්‍යයෙන් වර්ෂයකට විනාශ වන ශුද්ධ වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර 38,000 ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. සියයට 70 කට වඩා වියනක් ලෙස වැසී පවතින වනාන්තර ඝන වනාන්තර ලෙස නිර්වචනය කර ඇති අතර කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයට අනුව, දැනට සිදුවන වන විනාශය තවදුරටත් එසේම පැවතුනහොත්, 1992 දී මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 24 ක්ව පැවති ඝන වනාන්තර බිම් ප්‍රමාණය වර්ෂ 2020 දී තවදුරටත් අඩු වී සියයට 17 ක් වීමට ඉඩ ඇත. ජනගහන අවශ්‍යතා නොනවත්වාම සපුරාලීමේ හැකියාව ක්‍රම ක්‍රමයෙන් ගිලිහී යන බවක් අපේක්ෂා කෙරෙන හෙයින් වන සම්පත්වල අනාගතය අඳුරු සහගත බව මෙයින් පෙන්නුම් කෙරේ.

කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇති පරිදි ඉඩම් අහිමිය, ඉඩම් භුක්ති ක්‍රමයේ නොයෙකුත් දුර්වලතා, මහා පරිමාණ කෘෂිකර්ම හා ජනපද යෝජනා ක්‍රම, ජලාශ සහ ජල විදුලිබල යෝජනා ක්‍රම, හේන් ගොවිතැන, වාණිජ බෝග සඳහා ස්වාභාවික වනාන්තර යොදා ගැනීම සහ වන සම්පත් අධි පරිභෝජනයද වන විනාශයට හේතු වේ. ස්වභාවික වනාන්තර විනාශවීම සහ එම වනාන්තර වල ස්වභාවය වෙනස්වීම ද රට තුළ බැරෑරුම් ප්‍රශ්න රාශියක් ඇති කිරීමට හේතු වේ. ජෛව ගෝලීය විවිධත්වය අඩුවීම (වන සතුන්ගේ සහ ශාකවල ජන්ම භූමිය වෙනස්වීම නිසා), ජලය සැපයීම අක්‍රමවත්වීම, ජලාශ සහ වාරි ඇළ මාර්ගවල ජලය ඉක්මනින් සිඳී යෑම, පාංශු ඛාදනය, පසෙහි ඇති සාරවත් බව විනාශවීම සහ දැව සැපයුම හීනවීම නිසා කෘෂි නිෂ්පාදනයට අහිතකර ප්‍රතිඵල ඇති කරයි.

කෘෂිකර්ම ඉඩම් සහ වන සම්පත් අමාත්‍යාංශයේ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් හඳුනාගෙන ඇති පරිදි, දැනට ඇති වඩාත්ම ක්ෂණික අවශ්‍යතාවය වන්නේ, කෘෂිකාර්මික සංවර්ධනය සහ ජනාවාස ප්‍රතිපත්තියට මඟ පෙන්වනු ලබන, ජාතික ඉඩම් පරිභෝජනය කිරීමේ ප්‍රතිපත්තියක් සැකසීමයි. මේ මගින් බලාපොරොත්තු වන්නේ, ජෛව ගෝලීය විවිධත්වය ආරක්ෂා කිරීම, දිය බස්නාවන් ආරක්ෂා කිරීම, ඉඩම් අහිමි අයට ඉඩම් ලබාදීම සහ දැව හා අනෙකුත් වන නිෂ්පාදන ප්‍රමාණවත් තරම් සැපයීමයි. 1995 වර්ෂයේදී ජාතික වන ප්‍රතිපත්තිය රජය මගින් අනුමත කරන ලදී. වන වගා අංශයෙහි ප්‍රශස්ත වර්ධනයක් ලබා ගැනීම සඳහා සපිරි දිගුකාලීන සංවර්ධන රාමුවක් 1995 වර්ෂයේදී කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශය මගින් සකස් කර ඇත. 1995-2020 දක්වා වකවානුව ආවරණය කරන මෙය, ප්‍රධාන වන වගා සැලසුම වශයෙන් හඳුන්වයි. මෙම ප්‍රධාන වන වගා සැලසුම යටතේ ඉතිරිව ඇති ස්වාභාවික වන සම්පත සංරක්ෂණය කිරීම තුලින් ජෛව ගෝලීය විවිධත්වය ආරක්ෂාකිරීමත්, වන වගාව ප්‍රවර්ධනය කිරීමත් සිදුකරන අතර, විශේෂයෙන් ග්‍රාමීය ජනතාව දැණුවත්කිරීම තුලින් තම අවශ්‍යතාවයන් සඳහා ලබා ගන්නා දැව සහ දර වලට ඇති ඉල්ලුම වැඩිවීම හේතුකොටගෙන වන සම්පතට සිදුවන හානිය වළක්වා ගැනීමටත් බලාපොරොත්තු වේ. වේගයෙන් සිදුවන වන විනාශයට පිළියමක් වශයෙන් ඉහත සැලැස්මට අනුව වාර්ෂිකව හෙක්ටයාර 3,000 ක වන වගා කිරීමට සැලසුම් කර ඇත. වසර 2000 සිට, හෙක්ටයාර 200 ක ඝන වනාන්තර සහ හෙක්ටයාර 1,000 ක ලඳු කැලෑ සහ කඩොලාන ප්‍රකෘති භාවයට පත් කිරීමටත් හෙක්ටයාර 4,000 ක පමණ නැවත වන වගා කිරීමටත් සැලසුම් කර ඇත.

1995 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ජාත්‍යාන්තර සංවර්ධන සංගමය සහ විදේශීය සංවර්ධන පාලන අධිකාරය සමග එක්ව දශලක්ෂ 8.2 ක පැල ඇතිකිරීමට, හෙක්ටයාර 3,475 ක නැවත වන වගා කිරීමට, හෙක්ටයාර 23,864 ක වන වගා නඩත්තු කිරීමට සහ වනාන්තර ප්‍රදේශ වලින් හෙක්ටයාර 11,481 ක වන විද්‍යාත්මක ප්‍රතිකර්ම වලට සහභාගි වීමට හැකි විය. සහභාගිත්ව වන වගා ව්‍යාපෘතිය යටතේ (විශේෂයෙන් දැව ඉන්ධන සහ එදිනෙදා පාවිච්චි කරන දැව සැපයුම වැඩි කිරීම සඳහා) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දළ වශයෙන් ගෙවතු ආශ්‍රිතව හෙක්ටයාර 6,900 ක් වගා කිරීම සඳහා ගොවීන් ඇතුළුව පවුල් 51,000 කටත් වඩා වැඩි ප්‍රමාණයකගේ සහභාගිත්වය ලබාගත් අතර පාර දෙපස හා ගංගා ඇලදොල දෙපස කිලෝ මීටර් 127 ක තීරු වන වගාව කරන ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතිය යටතේම පාසැල්, රාජ්‍ය නොවන සංවිධාන, කෘෂිකාර්මික මධ්‍යස්ථාන සහ ගොවි සංවිධාන සමඟ එක්ව පැල දශලක්ෂ 4.4 කටත් වඩා වැඩි ප්‍රමාණයක් රෝපණය කරන ලදී. වන ව්‍යාප්ති වැඩපිළිවෙල යටතේ දශලක්ෂ 1.2 කට වඩා පැල සංඛ්‍යාවක් රෝපණය කරන ලදී. මෙම විවිධ වැඩපිළිවෙලවල් යටතේ, වර්ෂයේ ඉලක්ක කරන ලද ප්‍රමාණයෙන් සියයට 85 ක පමණ ප්‍රමාණයක් ලඟා කර ගැනීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හැකිවිය. මීට අමතරව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට නැවත වන වගා කිරීම සහ වන ව්‍යාප්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් පවත්වාගෙන යාමටද හැකිවිය.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුව, 1995 වර්ෂයේදී වන නීති උල්ලංඝනය කිරීම් 5,191 ක් වාර්තා විය. මෙයට, දැව ඝන ඝෙසි මීටර දශලක්ෂ 2.7 ක් අයත් වූ අතර එහි වටිනාකම රුපියල් දශලක්ෂ 29.3 ක් ලෙස ගණන් බලා ඇත. මෙයට ඇතුලත් වන්නේ රාජකාරි මට්ටමින් වාර්තාගත වූ වන විනාශ කිරීම් පමණක් වන අතර විශාල ප්‍රමාණයක වන විනාශයක් හෙළි නොවන අයුරින් සිදුවේ.

1995 වර්ෂයේ වන වගා අංශයේ පාරිසරික කළමණාකරණයට සියලුම ස්වාභාවික වනාන්තරවල ජෛව ගෝලීය විවිධත්වය මනින ජාතික සංරක්ෂණ සමීක්ෂණයද, සිංහරාජ සංරක්ෂණ ව්‍යාපෘතිය, නකල්ස් සංරක්ෂණ ව්‍යාපෘතිය සහ කඩොලාන සංරක්ෂණ ව්‍යාපෘතිය යන ඒවායෙන් සමන්විත විය. වන වගා අංශය සංවර්ධන කිරීමේ අරමුණෙන්, වර්ෂය තුලදී විවිධාකාර වූ පර්යේෂණ කටයුතු දිගටම කරගෙන යන ලදී. ශාඛ වර්ධනයට අදාල අත්හදාබැලීම් සහ යටි වගාව, කට්ටි තේක්ක වගාව, පොහොර භාවිතය හා ගිණි ආරක්ෂණ ක්‍රම මෙම පර්යේෂණවලට ඇතුලත් විය.